**<u>බස්නාහිර පළාත්බද කොළඹ මහාධිකරණයේදීය.</u>**

**<u>මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මැතිතුමා ඉදිරිපිටදීය.</u>**

වාර්තා කලේ:- තිළිණි මදුෂාණි විසිනි.

<u>නඩු අංකය:- HC 8264/16</u> <u>දිනය:- 2022.06.06</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**<u>පැමිණිල්ල</u>**

**විරුද්ධව**

1. ප්‍රසන්න රණතුංග
2. මොරීන් ස්ටෙලා රණතුංග
3. නරේෂ් කුමාර් ෆාරික්

**<u>චූදිතයන්</u>**

# තීන්දුව

මෙම නඩුවේ චූදිතයන් තිදෙනාට එරෙහිව ඉදිරිපත් කර ඇති අධි චෝදනා පත්‍රය චෝදනා 15 කින් සමන්විතය. එම චෝදනා පහත පරිදි සාරාංශගත කල හැක.

1. 2015.04.10 දින හෝ ඊට ආසන්න දිනකදී කොළඹදී ක්‍රිස්ටියන් ගිහාඩ් මෙන්ඩිස් නැමැත්තාට (මෙහි මින් මතු "පැමිණිලිකරු" ලෙස හඳුන්වනු ලබන) බියක් ඕනෑකමින්ම ඇතිකර චෙක්පත් කිහිපයක් චූදිතයන්ට භාරදීමට ඔහු වංක ලෙස පොලඹවා බලෙන් ලබා ගැනීමේ වරද සඳහා කුමන්ත්‍රණය කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 113 ආ. සහ 102 වගන්ති සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

2. 1 චෝදනාවේ සඳහන් වේලාවේදී, ස්ථානයේදී සහ එම ක්‍රියාකලාපයේදීම 1 චූදිත විසින් පැමිණිලිකරුට අදාලව අංක 597706, 597707, 597708, 597709 සහ 597718 දරණ චෙක්පත් 2 චූදිතට භාර දීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

3. 2 චෝදනාවේ සඳහන් වරදට 2 චූදිත විසින් 1 චූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

4. 2 චෝදනාවේ සඳහන් වරදට 3 වූදිත විසින් 1 වූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

5. 1 චෝදනාවේ සඳහන් වේලාවේදී, ස්ථානයේදී සහ එම ක්‍රියාකලාපයේදීම 1 වූදිත විසින් පැමිණිලිකරුට අදාලව අංක 597713, 597714, 597715, 597716, 597717 සහ 597719 දරණ චෙක්පත් 3 වූදිතට භාරදීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

6. 5 චෝදනාවේ සඳහන් වරදට 2 වූදිත විසින් 1 වූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

7. 5 චෝදනාවේ සඳහන් වරදට 3 වූදිත විසින් 1 වූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

8. 2015.05.07 දින හෝ ඊට ආසන්න දිනකදී කොළඹදී පැමිණිලිකරුට බියක් ඕනෑකමින්ම ඇතිකර චෙක්පත් කිහිපයක් 1 වූදිතට භාරදීමට ඔහු වංක ලෙස පොළඹවා බලෙන් ලබා ගැනීමේ වරද සඳහා කුමන්ත්‍රණය කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 113 ආ. සහ 102 වගන්ති සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

9. 8 චෝදනාවේ සඳහන් වේලාවේදී, ස්ථානයේදී සහ එම ක්‍රියාකලාපයේදීම 1 වූදිත විසින් පැමිණිලිකරුට අදාලව අංක 597749, 597750, 597751, 597753,597745, 597746, 597747 සහ 597754 දරණ චෙක්පත් තමාට භාරදීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

10. 9 චෝදනාවේ සඳහන් වරදට 2 වූදිත විසින් 1 වූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

11.9 චෝදනාවේ සඳහන් වරදට 3 වූදිත විසින් 1 වූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

12. 2015.06.02 දින හෝ ඊට ආසන්න දිනකදී කොළඹදී පැමිණිලිකරුට බියක් ඕනැකමින්ම ඇතිකර ප්‍රොමිසරි නෝට්ටු (පොරොන්දු නෝට්ටු) 5 ක් 1 වූදිතට භාරදීමට ඔහු වංක ලෙස පොලඹවා බලෙන් ලබා ගැනීමේ වරද සඳහා කුමන්ත්‍රණය කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 113 ආ. සහ 102 වගන්ති සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

13. 12 චෝදනාවේ සඳහන් වේලාවේදී, ස්ථානයේදී සහ එම ක්‍රියාකලාපයේදීම 1 වූදිත විසින් පැමිණිලිකරුට අදාලව පොරොන්දු

නෝට්ටු 5 ක් තමාට භාරදීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

14. 13 චෝදනාවේ සඳහන් වරදට 2 චූදිත විසින් 1 චූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

15. 13 චෝදනාවේ සඳහන් වරදට 3 චූදිත විසින් 1 චූදිතට අනුබල දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 373 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක්.

ඒ අනුව 1, 8 ,12 චෝදනා සියළු චූදිතයන්ට එරෙහිව නගා ඇත. ඊට අමතරව 1 චූදිතට එරෙහිව 2, 5, 9, 13 චෝදනා නගා ඇත. 2 චූදිතට එරෙහිව 3, 6, 10, 14 චෝදනා නගා ඇත. 3 චූදිතට එරෙහිව 4, 7, 11, 15 චෝදනා නගා ඇත.

3 චූදිතට එරෙහිව නඩු විභාගය පවත්වා ඇත්තේ ඔහු නොමැතිව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 241 වගන්තියේ ප්‍රතිපාදන යටතේය.

පැමිණිල්ල වෙනුවෙන් පැමිණිලිකරු, දසුන් සමරවික්‍රම, ඇමති ආරක්ෂක අංශයේ පො.කො. ප්‍රේමදාස, බිමල් ප්‍රනාන්දු, ඉන්දික පෙරේරා,කා.පො.ප. ධම්මිකා, මාදම්පෙරුම ආරච්චිලාගේ ශ්‍රීමතී, චිත්‍රා ජයන්ති සහ රවීන්ද්‍ර දොඩම්පේගමගේ යන සාක්ෂිකරුවන් සාක්ෂි දී ඇත. චූදිතයන්ට විත්තිවාචකය ඉදිරිපත් කිරීමට නියම කරන ලදුව 1, 2

වූදිතයන් විත්තිකූඩුවේ සිට ප්‍රකාශ කල අතර ඔවුන් වෙනුවෙන් නුවන් රාජපක්ෂ නැමති සාක්ෂිකරු සාක්ෂි දෙන ලදී.

1 වූදිත එවකට බස්නාහිර පලාතේ ප්‍රධාන අමාත්‍යවරයා වූ අතර 2 වූදිත ඔහුගේ බිරිඳ වේ. 3 වූදිත 1, 2 වූදිතයන්ගේ පවුලේ සමීප හිතවතෙකි.

නඩු විභාගයේදී ඉදිරිපත් වූ සාක්ෂි මා විසින් සැලකිල්ලෙන් සලකා බලන ලදී. එබැවින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සාරාංශගත කරමින් නැවත මෙම තීන්දුවේ දීර්ඝ ලෙස සඳහන් කිරීමට මම අදහස් නොකරමි. මා බලාපොරොත්තු වන්නේ එක් එක් සාක්ෂිකරුගේ සාක්ෂිය සමස්තයක් ලෙස සලකමින් විශ්ලේෂණය කර සුදුසු නිගමනයන්ට එළඹීමටයි.

<u>පැමිණිල්ලේ නඩුව</u>

පැමිණිලිකරුගේ සාක්ෂියෙන් පහත සඳහන් කරුණු අනාවරණය වේ.

1. පැමිණිලිකරු Silicon Technologies සමාගමේ විධායක අධ්‍යක්ෂකවරයා වන අතර එය ඔහුගේම ව්‍යාපාරයකි.
2. ඔහු 2013.09.20 දින අජිත් පැස්කුවල් නැමැත්තකුගෙන් ඉඩමක් මිලට ගත්තේය. මීතොටමුල්ලේ පිහිටි එම ඉඩම අක්කර 2 පර්චස් 2.8 ක ඉඩමකි. ඊට අදාල අංක 4201 දරණ ඔප්පුව (විකුණුම්කරය) X 1 ලෙස සලකුණු කර ඇත. පැමිණිලිකරු මෙම ඉඩම මිලට ගත් අවධියේ ඉඩමට ඇතුල් වන මාර්ගයේ අනවසර පදිංචිකරුවන් පිරිසක් පදිංචිව

සිටි අතර ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කරවා ගැනීම සම්බන්ධයෙන් 1 වූදිතගේ නිල නිවසේ සාකච්ඡාවක් පැවතිණ. ඒ පැමිණිලිකරු විසින් ඉඩම මිලට ගැනීමට මාස හයකට පමණ පෙරය. පැමිණිලිකරු මුල් වරට 1 වූදිත හඳුනාගෙන ඇත්තේ ඉහත කී සාකච්ඡාවේදීය. 3 වූදිත ඊට පෙර සිටම පැමිණිලිකරු හඳුනන තැනැත්තෙකි.

3. අනවසර පදිංචිකරුවන්ට විකල්ප පදිංචි ස්ථාන ලබා දීමෙන් අනතුරුව ඔවුන් ඉඩමෙන් ඉවත් වී ඇත. පැමිණිලිකරු විසින් මෙම ඉඩම මිලට ගැනීමෙන් පසුව එහි බස්නාහිර පලාත් සභාව සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධයෙන් ඔහු 1 වූදිත සමග සාකච්ඡා කර ඇත. ඒ සම්බන්ධයෙන් 1 වූදිත සහ පැමිණිලිකරු අතර හුවමාරු වූ ලිපි X 4 සහ X 5 ලෙස සලකුණු කර ඇත. කෙසේ නමුත් මූල්‍යමය අපහසුතාවයන් හේතුකොටගෙන එම ගබඩා සංකීර්ණය ඉදිකිරීමට පැමිණිලිකරු අපොහොසත් වී ඇත.

4. ඉන් පසුව මෙම ඉඩම විවිධාකාරයෙන් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් ( Memorandum of Understanding ) අත්සන් කරන ලදී. 2014.01.17 දිනැති එකී අවබෝධතා ගිවිසුම X 3 (අ) ලෙස සලකුණු කර ඇත. මෙම අවබෝධතා ගිවිසුමේ පාර්ශවකරුවන් වූයේ පැමිණිලිකරු, 3 වූදිතගේ බිරිඳ වන ෂෙවන්ති වනිගසේකර, 2 වූදිත සහ අජිත් පැස්කුවල්ය. මෙම අවබෝධතා ගිවිසුම අනුව ඉඩමෙන් පර්චස් 191.7 ක ප්‍රමාණයක් සහ

සම්පූර්ණ ලාභයෙන් 59% ක් පැමිණිලිකරුටද, ඉඩමෙන් පර්චස් 53.7 ක ප්‍රමාණයක් සහ සම්පූර්ණ ලාභයෙන් 17% ක් 3 වූදිතගේ බිරිඳටද, ඉඩමෙන් පර්චස් 43.7 ක ප්‍රමාණයක් සහ සම්පූර්ණ ලාභයෙන් 14% ක් 2 වූදිතටද, ඉඩමෙන් පර්චස් 33.7 ක ප්‍රමාණයක් සහ සම්පූර්ණ ලාභයෙන් 10% ක් අජිත් පැස්කුවල්ටද හිමිවේ. යම් හෙයකින් මෙම අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී යම් ගැටළුසහගත තත්වයක් උද්ගත වුවහොත් එය සුහදශීලී ලෙස සාකච්ඡා මාර්ගයෙන් විසඳාගත යුතු බවටද සියළු පාර්ශවකරුවන් එකඟ වී ඇත.

5. ඉන් පසුව පැමිණිලිකරු විසින් මෙම ඉඩම ටෝකියෝ සිමෙන්ති සමාගම වෙත විකුණන ලදී. ඊට අදාල 2015.04.07 දිනැති අංක 108 දරණ ඔප්පුව (විකුණුම්කරය) X 2 ලෙස සලකුණු කර ඇත. මෙම ගනුදෙනුවේ තැරැව්කරු ලෙස ක්‍රියාකර ඇත්තේ 1 වූදිත විසින් පැමිණිලිකරුට හඳුන්වා දුන් ගුණරත්න නැමැත්තාය. ඉඩම විකුණන ලද්දේ රුපියල් මිලියන 204.8 ක පමණ (රු. 204,820,000/-) මුදලකටය. එහෙත් පැමිණිලිකරුට එම මුදල නොලැබුණු අතර ඔහු ලබාගෙන තිබූ ණය මුදල් හේතුකොටගෙන එම මුදල කොමර්ෂල් ලීසිං ආයතනයට සහ LOLC ආයතනයට චෙක්පත් දෙකක් මගින් ලබා දී ඇත. ඉහත කී ඔප්පුව අත්සන් කල අවස්ථාවේ 3 වූදිතද එම ස්ථානයේ සිට ඇත.

6. ඉන් අනතුරුව 2015.04.10 දින පෙරවරුවේ දුරකථනයෙන් පැමිණිලිකරු අමතා ඇති 3 වූදිත ඔහුට දැනුම් දී ඇත්තේ චෙක්පොතද රැගෙන 1 වූදිතගේ නිල නිවසට පැමිණෙන ලෙසයි. ඒ අනුව පැමිණිලිකරු ඔහුගේ බිරිඳද සමග එදින සවස 1 වූදිතගේ නිල නිවසට ගියේය. ඒ අවස්ථාවේ 1, 2, 3 වූදිතයන් සහ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙක් නිල නිවසේ සිටි බවත්, චෙක්පත් ලිවීම සඳහා අසල තිබූ කෑම මේසයට එන ලෙස 3 වූදිත පැවසූ බවත්, ගණන් හිලව් ඉවර කර ගන්නා ලෙස 1 වූදිත පැවසූ බවත්, ඒ අවස්ථාවේ 1 වූදිත සුහදව කතා කල බවත්, චෙක්පත් 11 ක් ලියා පැමිණිලිකරු විසින් ඒවා 3 වූදිතට දුන් බවත් අනාවරණය වේ. ඒ රුපියල් මිලියන 5 සහ රුපියල් මිලියන 3 ලෙස වූ මුදල් චෙක්පත් 2 ක්, 2 වූදිතගේ නමට ලියූ චෙක්පත් 4 ක් සහ 3 වූදිතගේ නමට ලියූ චෙක්පත් 5 කි. චෙක්පත්වල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 64 කි. එම මුදල ගණනය කර ඇත්තේ ඉහත කී අවබෝධතා ගිවිසුම මගින් 2 වූදිතට සහ 3 වූදිතගේ බිරිඳට හිමි 31% ක (පිලිවෙලින් 14% සහ 17% ලෙස ) ප්‍රතිශතයට සමානුපාතිකවය. ඉඩම විකුණූ රුපියල් මිලියන 204.8 න් 31 % ක මුදල රුපියල් මිලියන 64 කට ආසන්න මුදලකි. ඉහත කී චෙක්පත් 11 පැමිණිල්ල විසින් X 6 සිට X 16 දක්වා සලකුණු කර ඉදිරිපත් කර ඇත. එම සියළු චෙක්පත් පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ විසින් අත්සන් කරන ලද හැටන් නැෂනල් බැංකුවේ අංක 0010016273 දරණ ගිණුමට අදාල චෙක්පත්ය.

7. ඉහත කී චෙක්පත් අතුරින් 2 චූදිතගේ නමට ලියන ලද රුපියල් මිලියන 5 ක චෙක්පතක් වූ අංක 597707 දරණ චෙක්පත (X 9) අගරු වී ඇති අතර අගරු වීමට හේතුව පැමිණිලිකරු විසින් ගෙවීම නැවැත්වීමයි. රුපියල් මිලියන 5 ක මුදල් චෙක්පතක් වූ අංක 597706 දරණ චෙක්පත (X 10) එදිනම මුදල් කරගෙන ඇත. ඉහත කී චෙක්පත් 11 අතුරින් මුදල් කර ගැනීමට හැකිවී ඇත්තේ රුපියල් මිලියන 8 ක් පමණි.

8. 2015.04.10 දිනට පසුව ( සතියක් හෝ සති දෙකක් ඇතුලත) නැවත වතාවක් 1 චූදිතගේ කාර්යාලයට පැමිණෙන ලෙස 3 චූදිත විසින් පැමිණිලිකරුට දන්වා ඇත. එම දැන්වීම අනුව පැමිණිලිකරු ඔහුගේ බිරිඳද සමග ගොස් 1 චූදිත හමුවී ඇති අතර එහිදී මුලින් ලබා දුන් චෙක්පත් මගින් ගෙවන ලද ( මුදල් කර ගන්නා ලද ) රුපියල් මිලියන 8 ක මුදල සහ ඉඩම සංවර්ධනය කිරීම සඳහා ඒ වන විට පැමිණිලිකරු විසින් වියදම් කර තිබූ මුදල අඩුකර රුපියල් මිලියන 34 ක පමණ මුදලක් ගෙවන ලෙස 1 චූදිත පැමිණිලිකරුට දන්වා ඇත. 3 චූදිතද ඒ අවස්ථාවේ එහි සිට ඇත.

9. 2015.04.10 දින සහ පැමිණිලිකරු 1 චූදිතගේ කාර්යාලයේදී ඔහු හමුවූ දින අතර කාලය තුල ඔවුන් දෙදෙනා අතර දුරකථන සංවාදයක්ද සිදුවී ඇත. එය සුහදශීලී ලෙස සිදුවූවකි.

10. ඉන් පසුව පැමිණිලිකරු විසින් ඔහුගේ සමාගමේ සාමාන්‍යාධිකාරී බිමල් ප්‍රනාන්දු මගින් චෙක්පත් 8 ක් ( X 18 සිට X 25 ) 1 වූදිතගේ නිල නිවස වෙත යවා ඇත. වූදිතයන් නිවසේ නොසිටි බැවින් මෙම චෙක්පත් භාරදී ඇත්තේ නිවසේ සිටි ආරක්ෂක නිලධාරීන්ටය. එම චෙක්පත්වල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 34 ක් පමණ වේ. එම චෙක්පත් අතුරින් 4 ක් 2 වූදිතගේ නමට ලියා ඇති අතර 3 වූදිතගේ නමට අනෙක් චෙක්පත් 4 ලියා ඇත. එම චෙක්පත් අතුරින් 2 වූදිතගේ නමට ලියන ලද රුපියල් මිලියන 5 ක චෙක්පතක් වූ අංක 597749 දරණ චෙක්පත (X 21 ) අගරු වී ඇති අතර අගරු වීමට හේතුව පැමිණිලිකරු විසින් ගෙවීම නැවැත්වීමයි. ඉහත කී චෙක්පත් 8 අතුරින් කිසිදු චෙක්පතක් මුදල් කර ගැනීමට හැකිවී නැත. පැමිණිලිකරු විසින් සියළු චෙක්පත්වල ගෙවීම නවත්වා ඇත.

11. X 18 සිට X 25 දක්වා වූ චෙක්පත් 8 යැවීමේදී පැමිණිලිකරු සහ 1 වූදිත අතර පැවති එකඟත්වය වූයේ ඊට පෙර පැමිණිලිකරු විසින් ලබා දුන් X 6 සිට X 16 දක්වා වූ චෙක්පත් 11 අතුරින් ඒ වන විට බැංකුගත නොකර ඉතිරිව තිබූ චෙක්පත් ( මුදල් කරගත් රුපියල් මිලියන 8 ට අදාල චෙක්පත් සහ අගරු වූ X 9 චෙක්පත හැර අනෙක් චෙක්පත් විය යුතුය ) පැමිණිලිකරු වෙත ආපසු ලබා දීමටයි. එහෙත් 1 වූදිත විසින් එම චෙක්පත් පැමිණිලිකරුට ආපසු ලබා දුන්නේ නැත.

ඇත්තෙන්ම පැමිණිලිකරු විසින් චූදිතයන්ට ලබා දුන් කිසිදු චෙක්පතක් ඔවුන් නැවත පැමිණිලිකරු වෙත ආපසු ලබාදී නැත.

12. 2015.05.12 දින පැමිණිලිකරු සහ 1 චූදිත අතර දුරකථන සංවාදයක් සිදුවී ඇත. එම දුරකථන සංවාදය පැමිණිලිකරු විසින් පටිගත කර ඇති අතර එය සුහදව සිදුවූ අදහස් හුවමාරුවකි.

13. ඉන් අනතුරුව 2015.05.29 දින 1 චූදිත සහ පැමිණිලිකරු අතර දුරකථන සංවාදයක් සිදුවී ඇත. මෙම දුරකථන සංවාදයද පැමිණිලිකරු විසින් පටිගත කර ඇත. එය 1 චූදිතගේ අංක 0777772520 දරණ ජංගම දුරකථනයෙන් පැමිණිලිකරුගේ අංක 0777686367 දරණ ජංගම දුරකථනය වෙත ලැබුණු ඇමතුමකි. එම දුරකථන සංවාදය ඇතුලත් සංයුක්ත තැටිය X 33 (ඇ) ලෙස සලකුණු කර ඇති අතර එම සංවාදයේ අන්තර්ගතය ඇතුලත් ලිඛිත පිටපත X 40 ලෙස සලකුණු කර ඇත.

14. ඉහත කී 2015.05.29 දින සිදුවූ දුරකථන සංවාදයේදී 1 චූදිත විසින් පැමිණිලිකරුට තර්ජනාත්මකව පවසා ඇත්තේ පැමිණිලිකරුට පැමිණීමට නොහැකි වුවත් තමාගේ වැඩේ කර ගැනීම සඳහා තමා පැමිණිලිකරු හමුවීමට පැමිණෙන බවත්, තමා නරක මිනිහා කර නොගන්නා ලෙසත්, පලමුව තමාගේ ප්‍රශ්නය විසඳන ලෙසත්ය. මෙහිදී 1 චූදිත විසින් අසභ්‍ය වචන භාවිත කර ඇති අතර “ තමුසෙ ” යනුවෙන්ද පැමිණිලිකරු අමතා ඇත.

15. ඉන් පසුව එදිනම සවස 5.00 ට 5.30 ට පමණ 1 චූදිත පිටකෝට්ටේ පිහිටි පැමිණිලිකරුගේ කාර්යාලය අසලට පැමිණ පැමිණිලිකරු 1 චූදිතගේ වාහනය අසලට කැඳවා නැවත ඔහුට තර්ජනය කර ඇත. ඒ "මාත් එක්ක දඟලන්න එන්න එපා. මගේ හැටි තමුසෙ දන්නවනේ. (අසභ්‍ය වචන කිහිපයක්). අද දවස ඇතුලත මගේ ප්‍රශ්නේ විසඳනවා. නැත්නම් තමුසෙ මම වැරදි මිනිහා කියන්න එපා" යනුවෙනි. ඒ අවස්ථාවේ පැමිණිලිකරුට බියක් ඇති වී ඇත.

16. ඉන් අනතුරුව 2015 ජූනි මස දිනයක තම නිවසට පැමිණ තමා හමුවන ලෙස 1 චූදිත පැමිණිලිකරුට දුරකථනයෙන් දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු බිමල් ප්‍රනාන්දුද සමග 1 චූදිතගේ නිවසට ගොස් ඇත. එහිදී පොරොන්දු නෝට්ටු 5 කට ( X 26 සිට X 30 ) අත්සන් කරන ලෙස 1 චූදිත පැමිණිලිකරුට පවසා ඇති අතර පැමිණිලිකරු ඊට අවනත වී ඒවා අත්සන් කර ඇත.

දසුන් සමරවික්‍රම නැමති හැටන් නැෂනල් බැංකුවේ නිලධාරියාගේ සාක්ෂියෙන් අනාවරණය වන්නේ 2015.04.10 දිනැති X 10 චෙක්පත (X 10 A ලෙස සලකුණු කර ඇත්තේද මෙම චෙක්පතමය) ප්‍රේමදාස නැමැත්තෙක් විසින් එදිනම බැංකුවට ඉදිරිපත් කර මුදල් ලබාගෙන ඇති බවයි. X 9 සහ X 21 දරණ චෙක්පත් ගෙවීම නැවැත්වීම හේතුකොටගෙන අගරු වී ඇති බවත්, මෙම චෙක්පත් සියල්ලම නිකුත් කර ඇත්තේ සිලිකන් ටෙක්නොලොජිස් ප්‍රයිවට් ලිමිටඩ් නැමති අංක 0010016273

දරණ ජංගම ගිණුමෙන් බවත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් වැඩිදුරටත් අනාවරණය වේ.

ඇමති ආරක්ෂක අංශයේ පො.කො. ප්‍රේමදාස සාක්ෂි දෙමින් පවසා ඇත්තේ එවකට ඔහු 1 චූදිතගේ ආරක්ෂාව සඳහා යොදවා සිටි බවත්, 2015.04.10 දින ඔහු 1 චූදිතගේ නිල නිවසේ සිට පංචිකාවත්ත හැටන් නැෂනල් බැංකුව වෙත ගිය බවත්, එසේ ගියේ 3 චූදිතද සමග බවත්, 3 චූදිත සතුව ඔහුගේ ජාතික හැඳුනුම්පත නොමැති බව ඔහු තමාට දැන්වූ බවත්, 3 චූදිතගේ ඉල්ලීම මත තමා X 10 චෙක්පත මාරුකර ගැනීම සඳහා තම අත්සන යෙදූ බවත්ය.

බිමල් ප්‍රනාන්දු නැමති සාක්ෂිකරු පැමිණිලිකරුගේ සමාගමේ සාමාන්‍යාධිකාරීවරයාය. පැමිණිලිකරුගේ උපදෙස් මත 1 චූදිතගේ නිල නිවසට චෙක්පත් කිහිපයක් රැගෙන ගොස් ඒවා එහි සිටි ආරක්ෂක නිලධාරියෙක් වෙත භාරදීම, 1 චූදිත පිටකෝට්ටේ පිහිටි පැමිණිලිකරුගේ කාර්යාලය අසලට පැමිණ පැමිණිලිකරුව ඔහුගේ වාහනය අසලට කැඳවාගෙන පැමිණිලිකරු සමග කතා කල බව, පැමිණිලිකරු තමාද සමග 1 චූදිතගේ නිවසට ගොස් පොරොන්දු නෝට්ටු අත්සන් කිරීම යනාදී කරුණු පිලිබඳව මෙම සාක්ෂිකරු සාක්ෂි දී ඇත.

ඩයලොග් ආයතනයේ විමර්ශන නිලධාරී ඉන්දික පෙරේරා නැමති සාක්ෂිකරුගේ සාක්ෂියෙන් පහත සඳහන් කරුණු අනාවරණය වේ.

1. 2015.05.12 දින පැය 7.31 ට පැමිණිලිකරුගේ ජංගම දුරකථනයෙන් 1 චූදිතගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලැබී ඇති බව සහ එම දුරකථන සංවාදය තත්පර 52 ක කාලයක් පැවති බව ( X 39 ඇ).
2. 2015.05.29 දින පැය 15.55 ට 1 චූදිතගේ ජංගම දුරකථනයෙන් පැමිණිලිකරුගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලැබී ඇති බව සහ එම දුරකථන සංවාදය තත්පර 95 ක කාලයක් පැවති බව ( X 42 ආ).

කා.පො.කො. ධම්මිකා නැමති සාක්ෂිකාරිය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ තමා මූල්‍ය අපරාධ කොට්ඨාශයට අනුයුක්තව සේවය කල අවධියේ මෙම නඩුවට අදාල විමර්ශනය සිදුකල බවත්, පැමිණිලිකරු විසින් දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය වෙත කරන ලද පැමිණිල්ල පොලිස්පතිවරයා විසින් මූල්‍ය අපරාධ කොට්ඨාශයට යොමුකල බවත්, එම පැමිණිල්ල පිලිබඳව විමර්ශනයක් පවත්වන ලෙස පොලිස්පතිවරයා විසින් 2015.06.24 දින මූල්‍ය අපරාධ කොට්ඨාශයට නියෝග කල බවත්, එදින පැමිණිලිකරු මූල්‍ය අපරාධ කොට්ඨාශයට ප්‍රකාශයක් කල බවත්ය. මෙම සාක්ෂිකාරිය වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ 2 චූදිතගේ ප්‍රකාශය 2015.07.02 සහ 2015.07.08 දිනවල සටහන් කරගත් බවත්, 1 චූදිතගේ ප්‍රකාශය 2015.07.20 දින සටහන් කරගත් බවත්, 3 චූදිත විදේශගතව සිටි බැවින් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීමට නොහැකි වූ බවත්, අංක 597706 (X 10) හා අංක 597719 ( X 16) දරණ චෙක්පත් දෙක පමණක් නිෂ්කාශනය වූ

බව විමර්ශනයේදී අනාවරණය වූ බවත්ය. මෙම සාක්ෂිකාරිය විසින් පැමිණිලිකරුගෙන් ටැබ් යන්ත්‍රයක් ( X 17 ), X 33 සංයුක්ත තැටියද සමග සංයුක්ත තැටි 7 ක් සහ ලේඛන කිහිපයක් භාරයට ගෙන ඇත. තවද 2 චූදිත විසින් චෙක්පත් කිහිපයක මුල් පිටපත් (X 6, X 7, X 8, X 18, X 19, X 20), X 9 චෙක්පතට අදාල අගරු නිවේදනය, X 21 චෙක්පතට අදාල අගරු නිවේදනය සහ පොරොන්දු නෝට්ටු 5 ක් ( X 26 සිට X 30) මෙම සාක්ෂිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. 3 චූදිත ඒ වන විට විදේශගතව සිටි බැවින් ඔහු භාරයේ තිබූ චෙක්පත් සොයා ගැනීමට නොහැකි වූ බව සාක්ෂිකාරිය පවසා ඇත.

මාදම්පෙරුම ආරච්චිගේ ශ්‍රීමතී නැමති සාක්ෂිකාරිය ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරියයි. මෙම නඩුවට අදාල ඉඩම සංවර්ධනය කිරීමට සහ ගොඩ කිරීමට අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් මෙම සාක්ෂිකාරිය සාක්ෂි දී ඇත.

චිත්‍රා ජයන්ති නැමති සාක්ෂිකාරිය 1 චූදිත බස්නාහිර පලාතේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කල අවධියේ එම පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරියයි. මෙම නඩුවට අදාල ඉඩම සම්බන්ධයෙන් 1 චූදිත සහ පැමිණිකරු අතර හුවමාරු වූ ලිපිවල ( X 4 සහ X 5) සඳහන් 1 චූදිතගේ අත්සන මෙම සාක්ෂිකාරිය විසින් හඳුනාගෙන ඇත. 1 චූදිත විසින් එම ලිපි සඳහා යොදාගෙන ඇත්තේ ඔහු ප්‍රධාන අමාත්‍යවරයා ලෙස භාවිතා කරන ලිපි ශීර්ෂ බවත්, රාජකාරි ලිපිවල සාමාන්‍යයෙන්

යොමු අංක සඳහන් වන නමුත් මෙම ලිපිවල ඒ අයුරින් යොමු අංක සඳහන් නොවන බවත් මෙම සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත.

රවීන්ද්‍ර දොඩම්පේගමගේ නැමති සාක්ෂිකරු එවකට කොලොන්නාව නගර සභාවේ සභාපතිවරයායාය. ඒ අවධියේ 1 චූදිත බස්නාහිර පලාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස ක්‍රියාකල බවත්, මෙම නඩුවට අදාල ඉඩමේ අනවසර පදිංචිකරුවන් පිරිසක් පදිංචිව සිටි බවත්, තමා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 1 චූදිත හමුවූ බවත්, වෙනත් ස්ථානයකින් ඉඩම් සහ මුදල් ලබා දීමෙන් පසුව අනවසර පදිංචිකරුවන් ඉඩමෙන් ඉවත් වූ බවත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් අනාවරණය වේ.

**<u>විත්තියේ නඩුව</u>**

1 චූදිත විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් ඔහුගේ දේශපාලන ජීවිතය සහ එහිදී ඔහුට මුහුණ දීමට සිදුවූ විවිධ අභියෝග පිලිබඳව දීර්ඝ ලෙස සඳහන් කර ඇත. ඊට අමතරව ඔහු විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයෙන් පහත සඳහන් කරුණු අනාවරණය වේ.

1. 1 චූදිත පැමිණිලිකරු හඳුනාගෙන ඇත්තේ 3 චූදිත මගිනි. මෙම නඩුවට අදාල ඉඩමේ පදිංචිව සිටි අනවසර පදිංචිකරුවන් එම

ස්ථානයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් එවකට බස්නාහිර පලාතේ ප්‍රධාන අමාත්‍යවරයා වූ තමා මැදිහත් වූ බව 1 චූදිත ප්‍රකාශ කර ඇත.

2. 1 චූදිත සහ පැමිණිලිකරු අතර හුවමාරු වූ X 4 සහ X 5 ලිපි තමා විසින් නිකුත් කලේ අදාල ඉඩම සංවර්ධනය කිරීම සඳහා පැමිණිලිකරු ලබා ගැනීමට බලාපොරොත්තු වු ණය මුදලක් ලබා ගැනීම පහසු කරවීම පිණිස ඔහුට කරන උදව්වක් ලෙස බව 1 චූදිතගේ ස්ථාවරයයි. ඒ සම්බන්ධයෙන් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ එම ලිපිවල සඳහන් ආකාරයට පලාත් සභාව සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධයෙන් තමා සහ පැමිණිලිකරු අතර කිසිදු එකඟත්වයක් ඇති නොවූ බවයි. 1 චූදිතගේ ස්ථාවරය වන්නේ X 4 සහ X 5 ලිපි නිකුත් කරන ලද්දේ ඔහුගේ පෞද්ගලික ලිපි ශීර්ෂවල බවයි.

3. 3 චූදිතගේ දැන්වීම මත තම බිරිඳ ( 2 චූදිත) මෙම ඉඩම සඳහා රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බවත්, එසේ කලේ එම ඉඩම සංවර්ධනය කර විකිණීමේ බලාපොරොත්තුවක් පිලිබඳව සහ ඒ සඳහා පැමිණිලිකරු සතුව ප්‍රතිපාදන නොමැත්තේය යන කරුණ පිලිබඳව 3 චූදිත කල දැන්වීම අනුව බවත් 1 චූදිත ප්‍රකාශ කර ඇත.

4. තමන් ආයෝජන කල මුදල සඳහා යම් තහවුරු කිරීමක් අවශ්‍ය බව තමා විසින් 3 චූදිතට දැන්වූ බවත්, ඒ අනුව අවබෝධතා ගිවිසුමක් සකස් කල බවත්, ඉඩම විකුණා එකඟ වූ පරිද්දෙන් ලාභ බෙදා ගැනීමට පැමිණිලිකරු තමාට යෝජනා කල බවත්, ඒ සඳහා තමා විසින්

ගුණරත්න නැමති තැරැව්කරුවෙක්ද පැමිණිලිකරුට හඳුන්වා දුන් බවත්, ඉඩම ටෝකියෝ සිමෙන්ති සමාගමට විකුණූ බව තමා දැනගත් බවත්, ඉඩම විකුණුවේ තමාගේ සහ තම බිරිඳගේ අනුමැතිය මත බවත් 1 වූදිත පවසා ඇත.

5. ඉඩම විකිණීමෙන් පසුව 1 වූදිත , 2 වූදිත, 3 වූදිත, 3 වූදිතගේ බිරිඳ, පැමිණිලිකරු සහ පැමිණිලිකරුගේ බිරිඳ 1 වූදිතගේ නිවසේදී හමුවී ඇත. ඒ අවස්ථාවේ සුහදශීලී ලෙස පැමිණිලිකරු විසින් චෙක්පත් කිහිපයක් ලබා දී ඇත. එම චෙක්පත් අතුරින් රුපියල් මිලියන 5 ක චෙක්පතක් එදිනම මුදල් කරගෙන ඇත.එම චෙක්පත් අතුරින් එක් චෙක්පතක් බැංකුගත කල විට අගරු වී ඇත.
6. ඉන් පසුව පැමිණිලිකරු විසින් ඉඩම සඳහා වියදම් කල මුදල අඩුකර ඉතිරි මුදල බෙදා ගැනීමට සියළු දෙනා එකඟ වී ඇත.
7. ඉන් අනතුරුව පැමිණිලිකරු විසින් නැවත චෙක්පත් කිහිපයක් ඔහුගේ සමාගමේ සාමාන්‍යාධිකාරීවරයා මගින් 1 වූදිතගේ නිවසට එවා ඇත. එම චෙක්පත් භාරගෙන ඇත්තේ නිවසේ ආරක්ෂාවට සිටි තැනැත්තෙකි. ඒ අවස්ථාව වන විට 1 වූදිත සහ පැමිණිලිකරු අතර කිසිදු ආරවුලක් තිබී නැති අතර චෙක්පත් ලබා දෙන අවස්ථාවේදී කිසිදු බලපෑමක් හෝ තර්ජනයක් සිදුවී නැත.

8. එම චෙක්පත් අතුරින් එක් චෙක්පතක් බැංකුගත කල බවත්, එය අගරු වූ බවත්, පැමිණිලිකරු මුදල් ගෙවීම මගහරින බව ඒ අවස්ථාවේ තමාට වැටහුන බවත් 1 චූදිත ප්‍රකාශ කර ඇත.

9. ඉන් පසුව අවස්ථා කිහිපයකදී දුරකථන ඇමතුම් මගින් තමා පැමිණිලිකරුගෙන් මුදල් ඉල්ලා සිටි බවත්, පොරොන්දු නෝට්ටු වලට අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස තමා පැමිණිලිකරුට දැන්වූ බවත්, ඔහු එය දින කිහිපයක්ම මගහරින ලද බවත් 1 චූදිත පවසා ඇත.

10. එක් දිනක පැමිණිලිකරු සහ ඔහුගේ සමාගමේ සාමාන්‍යාධිකාරීවරයා තම නිවසට පැමිණි බවත්, ඒ අවස්ථාවේ පැමිණිලිකරු පොරොන්දු නෝට්ටු වලට අත්සන් කල බවත් 1 චූදිත ප්‍රකාශ කර ඇත.

11. තමා කිසිදු අවස්ථාවක තර්ජනය කිරීමක් හෝ බිය වැද්දීමක් සිදු නොකල බව 1 චූදිතගේ ස්ථාවරයයි.

2 චූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ හරය පහත පරිදි වේ.

1. 3 චූදිතගේ ඉල්ලීම මත අදාල ඉඩම සඳහා රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බවත්, තම පවුලේ ව්‍යාපාරයක් වූ ඉන්ධන පිරවුම්හල් ව්‍යාපාරයට අදාල ගිණුමෙන් රුපියල් මිලියන 10 ක් ලබා ගෙන එම මුදලින් රුපියල් මිලියන 5 ක් මේ සඳහා ආයෝජනය කල බවත් 2 චූදිත ප්‍රකාශ කර ඇත.

2. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු, 3 වූදිතගේ බිරිඳ, අජිත් පැස්කුවල් සහ තමා පාර්ශවකරුවන් වූ ලේඛනයක් සකස් කර ඇත. මෙම ඉඩම පසුව ටෝකියෝ සිමෙන්ති සමාගමට විකුණා ඇත.

3. ඉන් පසුව පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ, 3 වූදිත සහ ඔහුගේ බිරිඳ තම නිවසට පැමිණි බවත්, ඒ අවස්ථාවේ චෙක්පත් කිහිපයක් තමන්ට ලබා දුන් බවත්, එය ඉතා සුහදව සිදුවූ හමුවීමක් බවත්, එම චෙක්පත් අතුරින් රුපියල් මිලියන 5 ක චෙක්පතක් එදිනම බැංකුගත කර මුදල් කරගත් බවත්, පසු දිනක බැංකුගත කල චෙක්පතක් අගරු වූ බවත් 2 වූදිත පවසා ඇත.

4. පසු දිනක පැමිණිලිකරු විසින් බිමල් ප්‍රනාන්දු මගින් චෙක්පත් කිහිපයක් එවා තිබූ බවත්, ඒවා තම නිවසේ ආරක්ෂක කුටිය වෙත භාරදී තිබූ බවත්, එම චෙක්පත් අතුරින් එක් චෙක්පතක් බැංකුගත කල අවස්ථාවේ එය අගරු වූ බවත් 2 වූදිත ප්‍රකාශ කර ඇත.

5. ඉන් පසුව තමා නිවසේ නොසිටි අවස්ථාවක පැමිණිලිකරු සහ බිමල් ප්‍රනාන්දු තම නිවසට පැමිණ තිබූ බවත්, ඔවුන් නිවසින් බැහැරව යාමේදී තමා සමගද කතා කල බවත්, ඔවුන් පැමිණි හේතුව 1 වූදිතගෙන් විමසීමේදී පොරොන්දු නෝට්ටු කිහිපයකට අත්සන් කල බව 1 වූදිත තමාට පැවසූ බවත්, ඒවා තමා විසින් සුරක්ෂිතව තැබූ බවත් 2 වූදිත පවසා ඇත.

6. පසු අවස්ථාවක මූල්‍ය අපරාධ කොට්ඨාශයෙන් ලැබුණු දැන්වීමක් මත තමා එහි ගිය බවත්, ඒ අවස්ථාවේ තමා සතුව තිබූ චෙක්පත් සහ ලේඛන මූල්‍ය අපරාධ කොට්ඨාශයට භාරදුන් බවත් පවසා ඇති 2 චූදිතගේ ස්ථාවරය වන්නේ ඇය කිසිදු වරදක් නොකල බවයි.

1, 2 චූදිතයන් වෙනුවෙන් කැඳවන ලද නුවන් රාජපක්ෂ නැමති සාක්ෂිකරු මහජන බැංකුවේ ගම්පහ ශාඛාවේ කළමණාකරුය.ඔහුගේ සාක්ෂියෙන් අනාවරණය වන්නේ 1, 2 චූදිතයන් අධ්‍යක්ෂකවරුන් ලෙස ක්‍රියා කරන සහන සේවා පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම නමින් ගිණුමක් මහජන බැංකුවේ ගම්පහ ශාඛාවේ පවත්වාගෙන යන බවත්, 2014.01.13 දින එම ගිණුමෙන් චෙක්පතක් මගින් රුපියල් මිලියන 10 ක මුදලක් ආපසු ලබාගෙන ඇති බවත්ය.

**<u>සාක්ෂි විශ්ලේෂණය මගින් සාක්ෂිවල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් නිගමනයන්ට එළඹීම</u>**

මුලින්ම පැමිණිලිකරුගේ සාක්ෂිය දෙස අවධානය යොමු කරමි. පැමිණිල්ලේ නඩුව බොහෝ සෙයින් නැතහොත් සම්පූර්ණයෙන්ම පාහේ රඳා පවතින්නේ පැමිණිලිකරුගේ සාක්ෂිය මත බව නඩුවේ කරුණු සමස්තයක් ලෙස සැලකීමේදී පැහැදිලිව පෙනේ. මා මීට පෙර සඳහන් කල ආකාරයට මෙම නඩුවට අදාල සම්පූර්ණ සිද්ධි මාලාව පිලිබඳව පැමිණිලිකරු විස්තරාත්මකව සාක්ෂි දී ඇත.

මෙම සිද්ධිය සිදුවන විට පැමිණිලිකරු නමින් සහ බස්නාහිර පලාතේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස නිලයෙන් 1 වූදිත හඳුනයි. ඔහු 2 වූදිතද නමින් සහ 1 වූදිතගේ බිරිඳ ලෙස හඳුනයි. පැමිණිලිකරු 3 වූදිත නමින් හඳුනන්නේ 1 වූදිත හඳුනා ගැනීමටද පෙර සිටය. වූදිතයන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ගත් එම ස්ථාවරයන් කිසිසේත්ම අභියෝගයට ලක්වී නැත.

පැමිණිලිකරුගෙන් විත්තිය විසින් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසා ඇත. 1 වූදිතට එරෙහිව ද්වේශසහගතව සහ සැලසුම්සහගතව පැමිණිල්ලක් ගොනු කල බවට විත්තියෙන් කල යෝජනාව ඔහු ප්‍රතික්ෂේප කර ඇත. විත්තියෙන් ඔහුට කල තවත් යෝජනාවක් වූයේ අදාල ඉඩමේ පලාත් සභාව සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට එකඟත්වයක් නොතිබූ බවයි. කෙසේ නමුත් 1 වූදිත සහ පැමිණිලිකරු අතර හුවමාරු වී ඇති X 4 සහ X 5 ලිපි අනුව පැහැදිලිව පෙනී යන්නේ එවන් එකඟත්වයක් තිබී ඇති බවයි. ඉඩම සංවර්ධනය කිරීම සඳහා 3 වූදිතගේ ඉල්ලීම මත 2 වූදිත විසින් රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බවට විත්තියෙන් කල යෝජනාව පැමිණිලිකරු ප්‍රතික්ෂේප කර ඇත. විත්තිය විසින් ගෙන ඇති මෙම ස්ථාවරය සැලකිල්ලෙන් සලකා බැලීමේදී පෙනී යන්නේ 2 වූදිත විසින් රුපියල් මිලියන 5 ක මුදලක් ඉඩම සඳහා ආයෝජනය කල බවට දිගින් දිගටම යෝජනා කර ඇති නමුත් එම මුදල පැමිණිලිකරු වෙත ලබා දුන් ආකාරය නිශ්චිතව යෝජනා කර නොමැති බවයි. තවද එම මුදල ලබා දුන්නේ පැමිණිලිකරුටද නැතහොත් 3 වූදිතටද යන කරුණ පවා

නිශ්චිතව වටහා ගත නොහැකි ආකාරයෙන් අවිනිශ්චිත යෝජනාවක් ලෙස මෙම යෝජනාව මුලින් ඉදිරිපත් කර ඇති බව පෙනේ. එය පැමිණිලිකරු විසින් දිගින් දිගටම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අවසානයේ එම මුදල 2 වූදිත විසින් පැමිණිලිකරුට ලබා දුන් බවට නිශ්චිත යෝජනාවක් කර ඇත. එම යෝජනාවද පැමිණිලිකරු ප්‍රතික්ෂේප කර ඇත. එම මුදල 2 වූදිත විසින් පැමිණිලිකරු වෙත ලබා දුන්නේ නම් ඒ බව මුලින්ම නිශ්චිතව යෝජනා කිරීමට විත්තියට තිබූ අපහසුතාවය කුමක්දැයි මා හට වටහාගත නොහැක. අවස්ථා දෙකකදී චෙක්පත් සහ එක් අවස්ථාවකදී පොරොන්දු නෝට්ටු ලබාදීමට සිදුවූයේ එම ආයෝජනය සම්බන්ධයෙන් බවට විත්තියෙන් කල යෝජනාව පැමිණිලිකරු ප්‍රතික්ෂේප කර ඇත. ඇත්තෙන්ම එම යෝජනාව පදනම් විරහිත බව පෙනේ. ඊට හේතුව වන්නේ චෙක්පත්වල සහ පොරොන්දු නෝට්ටුවල සඳහන් මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 5 කට වඩා බෙහෙවින් වැඩි මුදලක් වීමයි. පොරොන්දු නෝට්ටු අත්සන් නොකර 1 වූදිතගේ නිවසින් පිටව යාමට තිබූ බවට විත්තියෙන් කල යෝජනාව ප්‍රතික්ෂේප කරමින් පැමිණිලිකරු පවසා ඇත්තේ එම සිද්ධි මාලාව තර්ජනාත්මකව සිදුවූවක් බවයි.

3 වූදිත මෙම ඉඩම සඳහා රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බවට විත්තියෙන් කල යෝජනාව පැමිණිලිකරු ප්‍රතික්ෂේප කර ඇත. 3 වූදිත තමාට 1 වූදිතගේ බලය පිලිබඳව යම් කරුණු පැවසූ නමුත් ඔහු

පුද්ගලිකව තමාට තර්ජනය කිරිමක් නොකල බව පැමිණිලිකරු හරස් ප්‍රශ්නවලට පිලිතුරු දෙමින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගෙන් විත්තිය විසින් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසා ඇති අතර නඩුවේ හරයට සහ චෝදනාවලට සෘජුවම අදාල නොවන නොවැදගත් කරුණු රාශියක් පිලිබඳව හරස් ප්‍රශ්න අසා ඇති බව මට පෙනේ. අදාල ඉඩමේ ස්වභාවය, එහි පදිංචිව සිටි අනවසර පදිංචිකරුවන් ඉවත් කල ආකාරය, ඉඩම සංවර්ධනය කිරීම සහ ගොඩ කිරීම පිලිබඳ විස්තර, වි. 1 සිට වි. 11 දක්වා වු ලේඛන ඉදිරිපත් කරමින් පැමිණිලිකරු විසින් විවිධ මූල්‍ය ආයතන වලින් ලබා ගත් ණය මුදල් පිලිබඳ විස්තර යනාදී කරුණු ඒ අතුරින් ප්‍රධානය.

පැමිණිල්ලේ ස්ථාවරය අනුව මෙම නඩුවේ සිද්ධි දාමය අවසන් වී ඇත්තේ 2015.06.02 දිනය. පැමිණිලිකරු මෙම සිද්ධිය සම්බන්ධයෙන් දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය වෙත කරන ලද පැමිණිල්ල පොලිස්පතිවරයා විසින් මූල්‍ය අපරාධ කොට්ඨාශයට යොමු කරන ලදුව මූල්‍ය අපරාධ කොට්ඨාශය විමර්ශනය ආරම්භ කර ඇත. ඒ පොලිස්පතිවරයාගේ නියෝගයක් මතය. පැමිණිලිකරු විසින් 2015.06.24 දින මූල්‍ය අපරාධ කොට්ඨාශය වෙත මෙම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කර ඇත්තේ ඉහත පසුබිම තුලය. ඒ අනුව ඔහු සිදුවීම් මාලාවකින් සමන්විත සංකීර්ණ සිද්ධියක් වූ මෙම සිද්ධිය පිලිබඳව

අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව පොලිසියට ප්‍රකාශයක් කර ඇති බව පෙනේ.

පැමිණිලිකරු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශය ආශ්‍රයෙන් කිසිදු පරස්පරවිරෝධතාවයක් සලකුණු කිරීමට හෝ කිසිදු ඌනතාවක් කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරවීමට විත්තිය අපොහොසත් වී ඇත. පැමිණිලිකරුගේ සාක්ෂිය වැදගත් කරුණු නැතහොත් නඩුවේ හරයට බලපාන කරුණු සම්බන්ධයෙන් විශ්වසනීයත්වයට හානියක් සිදුවන පරිද්දෙන් අභියෝගයට ලක්වී නොමැති බව සාක්ෂිය සමස්තයක් ලෙස සැලකීමේදී පෙනේ.

පැමිණිලිකරු සිය සාක්ෂියේදී ගත් බොහෝ ස්ථාවරයන් ලේඛන මගින්ද තහවුරු වී ඇති බව පෙනේ. අදාල ඉඩමේ බස්නාහිර පලාත් සභාව සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධයෙන් 1 චූදිත සමග සාකච්ඡා කල බවට පැමිණිලිකරු ගත් ස්ථාවරය ඔවුන් අතර හුවමාරු වී ඇති X 4 සහ X 5 ලිපි මගින් තහවුරු වේ. තවද ඉඩම සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සහ ලාභ බෙදා ගැනීම සම්බන්ධයෙන් පැමිණිලිකරු සහ චූදිතයන් අතර මුලින් යම් ආකාරයක එකඟත්වයක් තිබූ බව X 3 (අ) අවබෝධතා ගිවිසුමෙන් තහවුරු වේ. පැමිණිලිකරු සහ චූදිතයන් අතර චෙක්පත් සහ පොරොන්දු නෝට්ටු හුවමාරු වූ ආකාරය පිලිබඳව පැමිණිලිකරු සිය සාක්ෂියේදී ගත් ස්ථාවරයන් අධිකරණය ඉදිරියේ සලකුණු කරන ලද අදාල චෙක්පත් ( X 6 සිට X 16 සහ X 18 සිට X

25) සහ පොරොන්දු නෝට්ටු (X 26 සිට X 30 ) මගින් තහවුරු වේ. පැමිණිලිකරු සහ 1 වූදිත අතර දුරකථන සංවාද සිදුවූ බවට පැමිණිලිකරු ගත් ස්ථාවරය දුරකථන විස්තර වාර්තා (X 39 ඇ සහ X 41 ආ) මගින් තහවුරු වේ.

පැමිණිලිකරු සහ 1 වූදිත අතර 2015.05.29 දින දුරකථන සංවාදයක් සිදුවූ බවත්, එහිදී 1 වූදිත විසින් පැමිණිලිකරුට තර්ජනය කල බවත් පැමිණිලිකරු සාක්ෂි දෙමින් පවසා ඇත. පැමිණිලිකරු විසින් එම දුරකථන සංවාදය පටිගත කර ඇති අතර එහි අන්තර්ගතය පිලිබඳව පසුව වැඩිදුරටත් කරුණු විග්‍රහ කිරීමට මම බලාපොරොත්තු වෙමි. එම දුරකථන සංවාදය ඇතුලත් සංයුක්ත තැටිය ( X 33 ඇ) සහ එහි අන්තර්ගතය ඇතුලත් මුද්‍රිත පිටපත ( X 40 ) මගින් ඒ සම්බන්ධයෙන් වූ පැමිණිලිකරුගේ ස්ථාවරය මැනවින් තහවුරු වේ.

මෙම දුරකථන සංවාදය පටිගත කිරීම සඳහා පැමිණිලිකරු යොදා ගෙන ඇති ක්‍රමවේදය වන්නේ ඔහුගේ ජංගම දුරකථනයට ලැබෙන ඇමතුම ටැබ් යන්ත්‍රයක් ( X 17 ) මගින් පටිගත කර එය ගබඩා කිරීමට සලස්වා සංයුක්ත තැටියකට පිටපත් කර ගැනීමයි. මෙම ක්‍රියාදාමය තුලදී ඉහත කී ජංගම දුරකථනය සහ ටැබ් යන්ත්‍රය නිසි ලෙස ක්‍රියාකරමින් තිබූ බවත්, දුරකථන සංවාදය පටිගත කිරීමේ ක්‍රියාවලිය කිසිදු අනිසි වෙනස් කිරීමකින් හෝ අනිසි මැදිහත් වීමකින් තොරව නිසි පරිදි සිදුවූ බවත් පැමිණිලිකරුගේ ස්ථාවරයයි. ඒ අනුව පෙනී යන්නේ

1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ විෂය පථය යටතට වැටෙන සමකාලීන රෙකෝඩනයක් (ශ්‍රව්‍ය රෙකෝඩනයක්) වන ඉහත කී දුරකථන සංවාදය සාක්ෂි ලෙස ආවේශ්‍ය කිරීමේදී එම පනතේ 4 වගන්තියේ ප්‍රතිපාදන නිසි පරිදි අනුගමනය කර ඇති බවයි. තවද එම පනතේ 7 වගන්තිය යටතේ විත්තිය වෙත ලබා දිය යුතු දැන්වීමද පැමිණිල්ල විසින් විත්තිය වෙත නිසි පරිදි ලබා දී ඇත.

ඉහත කී දුරකථන සංවාදය සම්බන්ධයෙන් අදාල වන තවත් කරුණක් මේ අවස්ථාවේ මෙහි සඳහන් කිරීම සුදුසු බව මට පෙනේ. පැමිණිල්ලේ සාක්ෂිකරුවෙක් ලෙස (පැ.සා. 50 ලෙස) අධිචෝදනා පත්‍රයේ ලැයිස්තුගත කර තිබූ මහාචාර්ය ගිහාන් වික්‍රමනායක නැමති සාක්ෂිකරු විසින් සකස් කරන ලද වාර්තාවක් X 38 ලෙස සලකුණු කර පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පැමිණිල්ල විසින් සලකුණු කර ඇත්තේ පැමිණිලිකරු මගිනි. මහාචාර්ය ගිහාන් වික්‍රමනායක විසින් සකස් කරන ලද X 38 වාර්තාව නිල නොවන සාක්ෂිකරුවෙක් වන පැමිණිලිකරු මගින් සලකුණු කිරීම කාර්ය පටිපාටික වශයෙන් දෝෂ සහගත බව මාගේ අදහසයි. විශේෂඥ සාක්ෂිකරුවෙක් විසින් සකස් කල මෙවන් වාර්තාවක් නිල නොවන සාක්ෂිකරුවෙක් මගින් සලකුණු කල නොහැක. එම වාර්තාව සලකුණු කල යුත්තේ අදාල විශේෂඥ සාක්ෂිකරු මගිනි. මහාචාර්ය ගිහාන් වික්‍රමනායක ඒ වන විට මියගොස් සිටි බැවින් ඔහු සාක්ෂිකරුවෙක් ලෙස කැඳවීමට පැමිණිල්ලට නොහැකි විය. වාර්තාව සකස් කල විශේෂඥ සාක්ෂිකරු නඩු විභාගයේදී සාක්ෂි දීමට පෙර මියගිය

මෙවන් අවස්ථාවක පැමිණිල්ල විසින් කල යුතුව තිබුණේ ඒ සම්බන්ධයෙන් අදාල වන සාක්ෂි ආඥා පනතේ 32 වගන්තියේ ප්‍රතිපාදන යටතේ ක්‍රියා කිරීමයි. කෙසේ නමුත් පැමිණිල්ල ඒ අයුරින් ක්‍රියා කර නැත. ඉහත කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ පැමිණිල්ල විසින් X 38 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති ඉහත කී වාර්තාවේ සඳහන් කරුණු (එහි අන්තර්ගතය) පිලිබඳව සලකා බැලීමේ නීතිමය හැකියාවක් මෙම අධිකරණයට නොමැති බවයි. එබැවින් X 38 ලෙස සලකුණු කර ඇති වාර්තාවේ අන්තර්ගතය මෙම නඩුවේ නිගමන වලට එලඹීමේදී කිසිසේත්ම යොදා නොගන්නා බව සඳහන් කරමි.

මෙහිදී විශේෂයෙන් මතක තබා ගත යුතු කරුණක් ඇත. එනම් මා ඉහත සඳහන් කල ආකාරයට 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන යටතේ කිසියම් සාක්ෂියක් ආවේශ්‍ය කර ගැනීම සඳහා විශේෂඥ සාක්ෂි අත්‍යවශ්‍ය නොවන බවයි. මා මීට පෙර සඳහන් කල ආකාරයට මෙම නඩුවේ පැමිණිලිකරුගේ සාක්ෂිය මගින් අදාල කරුණු තහවුරු වී ඇති බව පෙනේ.

මෙම නඩුවේ සිද්ධිමය කරුණුවල ස්වභාවය අනුව පැමිණිලිකරුගේ සාක්ෂිය සහ බිමල් ප්‍රනාන්දු නැමති සාක්ෂිකරුගේ සාක්ෂිය සංසන්දනාත්මකව සලකා බැලීම සුදුසු බව මට පෙනේ. 2015.05.29 දින 1 චූදිත පිටකෝට්ටේ පිහිටි පැමිණිලිකරුගේ කාර්යාලය අසලට පැමිණ ඔහු 1 චූදිතගේ වාහනය අසලට කැඳවා ඔහුට තර්ජනය කල බව

පැමිණිලිකරු සාක්ෂි දෙමින් පවසා ඇත. 1 වුදිත සහ පැමිණිලිකරු විනාඩි 5 ත් 10 ත් අතර කාලයක් කතා කල බවත්, තමා එය දුටු නමුත් තමා ඔවුන් කතා කල ස්ථානයෙන් ඉවත්ව සිටි බැවින් කතා කල දේවල් තමාට නොඇසුනු බවත් බිමල් ප්‍රනාන්දුගේ ස්ථාවරයයි. එසේනම් 1 වූදිත සහ පැමිණිලිකරු අතර ඒ අවස්ථාවේ සිදුවූ කතාබහේ අන්තර්ගතය පිලිබඳව පුද්ගලික දැනුමක් බිමල් ප්‍රනාන්දුට නැත. ඒ අනුව ඒ අවස්ථාවේ 1 වූදිතගෙන් පැමිණිලිකරුට කිසියම් තර්ජනයක් එල්ල වූයේ නම් ඒ පිලිබඳව බිමල් ප්‍රනාන්දු නොදනී. තවද එදින 1 වූදිත පැමිණිලිකරුගේ කාර්යාලය අසලට පැමිණීමට මද වේලාවකට පෙර 1 වුදිත සහ පැමිණිලිකරු අතර දුරකථන සංවාදයක් සිදුවූ බවත්, එහිදී 1 වූදිත පැමිණිලිකරුට තර්ජනය කල බවත් පැමිණිලිකරුගේ ස්ථාවරයයි. එය 1 වූදිත සහ පැමිණිලිකරු අතර සිදුවූ පුද්ගලික දුරකථන සංවාදයක් බැවින් එහි අන්තර්ගතය පිලිබඳවද පුද්ගලික දැනුමක් බිමල් ප්‍රනාන්දුට නැත. ඒ අනුව එම දුරකථන සංවාදය තුලදී 1 වූදිතගෙන් පැමිණිලිකරුට යම් තර්ජනයක් එල්ලවූයේ නම් ඒ පිලිබඳවද බිමල් ප්‍රනාන්දු නොදනී.

1 වූදිතගේ නිල නිවසේදී පැමිණිලිකරු පොරොන්දු නෝට්ටු අත්සන් කල අවස්ථාවේ කිසිදු තර්ජනයක් නොතිබූ බව බිමල් ප්‍රනාන්දු හරස් ප්‍රශ්නවලට පිලිතුරු දෙමින් පවසා ඇත. මා ඉහත සඳහන් කල ආකාරයට 2015.05.29 දින පැමිණිලිකරුගේ කාර්යාලය අසලදී 1 වූදිත සහ පැමිණිලිකරු අතර සිදුවූ කතාබහ බිමල් ප්‍රනාන්දුට ඇසී නැති අතර එදිනම ඊට පෙර 1 වූදිත සහ පැමිණිලිකරු අතර සිදුවූ දුරකථන සංවාදය පිලිබඳව

පුද්ගලික දැනුමක්ද ඔහුට නැත. එබැවින් පැමිණිලිකරු පොරොන්දු නෝට්ටු අත්සන් කල අවස්ථාවේ කිසිදු තර්ජනයක් නොතිබූ බවට බිමල් ප්‍රනාන්දු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පැවසීම විග්‍රහ කිරීමේදී ඉහත කී සිද්ධිමය පසුබිම කිසිසේත්ම අමතක නොකල යුතුය.

මෙම නඩුවේ ප්‍රධාන විමර්ශන නිලධාරිණිය ලෙස ක්‍රියාකර ඇත්තේ කා.පො.ප. ධම්මිකාය. ඇය එවකට මූල්‍ය අපරාධ කොට්ඨාශයට අනුයුක්තව සේවය කල පොලිස් පරීක්ෂකවරියකි. පැමිණිලිකරු විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් මුලින්ම පැමිණිලි කර ඇත්තේ දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය වෙතය. එම පැමිණිල්ල පොලිස්පතිවරයා විසින් මූල්‍ය අපරාධ කොට්ඨාශය වෙත යොමු කරන ලදුව මූල්‍ය අපරාධ කොට්ඨාශය විමර්ශනය ආරම්භ කර ඇත. ඒ පොලිස්පතිවරයාගේ නියෝගයක් මතය. පැමිණිලිකරු විසින් මුලින්ම දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය වෙත පැමිණිලි කලද මෙම නඩුවේ විමර්ශනය පවත්වා ඇත්තේ පොලිස්පතිවරයාගේ නියෝගයක් මත පොලිස් නිලධාරීන් විසිනි. ඒ අනුව මෙම නඩුවේ විමර්ශනය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 11 වන පරිච්ඡේදයේ ප්‍රතිපාදන යටතේ නීත්‍යානුකූලව පවත්වන ලද විමර්ශනයක් ලෙස සැලකිය යුතුය.

පැමිණිලිකරු විසින් මුලින්ම දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය වෙත පැමිණිලි කිරීම සහ මූල්‍ය අපරාධ කොට්ඨාශය මගින් ( FCID ) මෙම නඩුවේ විමර්ශනය පැවැත්වීම යම් ආකාරයකින් විත්තියේ දෝෂ

දර්ශනයට ලක් වී ඇත. පැමිණිලිකරු විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ එවකට බස්නාහිර පලාතේ ප්‍රධාන අමාත්‍යවරයා වූ 1 වූදිතට, ඔහුගේ බිරිඳට සහ තවත් තැනැත්තකුට එරෙහිවය. පලාත් ප්‍රධාන අමාත්‍ය ධූරය වූ කලී සැලකිය යුතු බලයක් සහිත තනතුරක් බව අමතුවෙන් කිව යුතු නැත. එවන් බලයක් සහිත තැනැත්තකුගෙන් එල්ල වූ තර්ජනයක් පිලිබඳව ඔහුට එරෙහිව ක්‍රියා කිරීමේදී සෑම තැනැත්තෙක්ම කිසිදු පැකිලීමකින් තොරව ලඟම පිහිටි පොලිස් ස්ථානය වෙත ක්ෂණිකව ගොස් ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරනු ඇතැයි සෑම විටම බලාපොරොත්තු විය නොහැක. එය එක් එක් පුද්ගලයාගේ මානසික මට්ටම, දරා ගැනීමේ ශක්තිය සහ වෙනත් අවස්ථානුගත කරුණු අනුව එකිනෙකාගෙන් වෙනස් විය හැක. ඇත්තෙන්ම මෙහිදී අධිකරණය විසින් සලකා බැලිය යුත්තේ අදාල විමර්ශනය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව නිසි පරිදි සිදුකර තිබේද යන්නයි. මා මීට පෙරද සඳහන් කල ආකාරයට මෙම නඩුවේ විමර්ශනය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව සිදුකර ඇති බව පැහැදිලිය. තවද එම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගෙන වූදිතයන්ට එරෙහිව මහාධිකරණය ඉදිරියේ නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇති බව තීරණය කර ඇත්තේ නීතිපතිවරයා විසිනි. ඒ අනුව එමගින් වූදිතයන්ට කිසිදු අගතියක් සිදුවී ඇති බවක් මා හට නොපෙනේ.

මම දැන් 1 වූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශය විශ්ලේෂණය කරමි. ඔහු විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ අන්තර්ගතය මා මීට පෙර විස්තරාත්මකව සඳහන් කර ඇත. ඔහුගේ ස්ථාවරය වන්නේ අදාල ඉඩමේ බස්නාහිර පලාත් සභාව සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධයෙන් තමා සහ පැමිණිලිකරු අතර කිසිදු එකඟත්වයක් ඇති නොවූ බවත්, X 4 සහ X 5 ලිපි නිකුත් කරන ලද්දේ තමාගේ පෞද්ගලික ලිපි ශීර්ෂවල බවත්ය. කෙසේ නමුත් X 4 සහ X 5 ලිපිවල අන්තර්ගතය සලකා බැලීමේදී පැහැදිලිව පෙනී යන්නේ ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමේ එකඟත්වය එම ලිපි වලින් මැනවින් පිලිබිඹු වන බවයි. නිදසුනක් ලෙස X 5 ලිපියේ ඉදිකිරීමට අපේක්ෂිත ගබඩා සංකීර්ණයේ වර්ග අඩි ප්‍රමාණය, ගෙවීමට අපේක්ෂිත මාසික කුලිය සහ එය ගණනය කරන ආකාරය පවා විස්තරාත්මකව සඳහන් කර ඇත. තවද එම ලිපි ශීර්ෂවල ඉහලින්ම රාජ්‍ය ලාංඡනය, 1 වූදිතගේ නම, ඔහු දැරූ ප්‍රධාන අමාත්‍ය නිලය, ඊට අමතරව ඔහු අමාත්‍යවරයෙක් ලෙස ක්‍රියාකල නිලයන්, ලිපියේ යොමු අංක සඳහා වෙන් කල නිශ්චිත ස්ථාන, 1 වූදිතගේ රාජකාරි ලිපිනය සහ එහි දුරකථන අංකය, ඔහු දරන නිලයන් සහ රාජකාරි ලිපිනය අඩංගු නිල මුද්‍රාව යනාදී කරුණු අඩංගු වේ. ඒ අනුව එම ලිපි ශීර්ෂ ඔහුගේ පෞද්ගලික ලිපි ශීර්ෂ ලෙස සැලකීමේ කිසිදු හැකියාවක් නොමැති බව මාගේ අදහසයි. ඇත්තෙන්ම එම ලිපි ශීර්ෂ ප්‍රධාන අමාත්‍ය ධූරයට අදාල නිල ලිපි ශීර්ෂ බවට කිසිදු සැකයක් නැත.

අනෙක් අතට X 4 සහ X 5 ලිපි පිලිබඳව 1 වූදිත තවත් ස්ථාවරයක් ගෙන ඇත. එනම් එම ලිපිවල සඳහන් ආකාරයට පලාත් සභාව සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධයෙන් තමා සහ පැමිණිලිකරු අතර කිසිදු එකඟත්වයක් නොතිබූ බවත්, එම ලිපි තමා විසින් නිකුත් කලේ අදාල ඉඩම සංවර්ධනය කිරීම සඳහා පැමිණිලිකරු ලබා ගැනීමට බලාපොරොත්තු වූ ණය මුදලක් ලබා ගැනීම පහසු කරවීම පිණිස ඔහුට කරන උදව්වක් ලෙස බවත්ය. වෙනත් වචන වලින් පවසන්නේ නම් පැමිණිලිකරුට කරන උදව්වක් ලෙස 1 වූදිත විසින් ප්‍රධාන අමාත්‍ය නිල ලිපි ශීර්ෂය යොදා ගනිමින් නිකුත් කර ඇත්තේ අසත්‍ය කරුණු අඩංගු ලිපි දෙකකි. එසේනම් එනයින්ම පෙනී යන්නේ 1 වූදිත තමා දැරූ ප්‍රධාන අමාත්‍ය ධූරයේ බලතල සහ වරප්‍රසාද අවභාවිතා කරමින් නැතහොත් අයුතු ලෙස පාවිච්චි කරමින් ක්‍රියාකර ඇති බවයි.

3 වූදිතගේ දැන්වීම මත තම බිරිඳ අදාල ඉඩම සඳහා රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බව 1 වූදිත පවසා ඇත. කෙසේ නමුත් එම මුදල පැමිණිලිකරු වෙත ලබා දුන් බව ඔහු කිසිදු අවස්ථාවක නිශ්චිතව ප්‍රකාශ කර නැත. එම මුදල “ආයෝජනය කිරීම” යන්නෙන් ඔහු අදහස් කලේ එම මුදල 3 වූදිතට ලබාදීමද නැතහොත් පැමිණිලිකරුට ලබාදීමද යන්න පවා පැහැදිලි නැත. ඔහු එක් අවස්ථාවක ප්‍රකාශ කර ඇත්තේ එම මුදල ආයෝජනය කිරීමට “ අපි එකඟතාවය දුන්නා” යනුවෙනි. මෙම මුදල පැමිණිලිකරුට ලබා දුන්නේ නම් ඒ බව පැහැදිලිව සහ නිශ්චිතව පැවසීමට 1 වූදිතට තිබූ අපහසුතාවය කුමක්ද?. අනෙක් අතට මෙම මුදල

සඳහා යම් තහවුරු කිරීමක් අවශ්‍ය බව 1 වූදිත විසින් පවසා ඇත්තේද 3 වූදිතට මිස පැමිණිලිකරුට නොවේ. එම මුදල පැමිණිලිකරුට ලබා දුන්නේ නම් ඒ සඳහා වූ තහවුරු කිරීම ඔහුගෙන්ම ලබා ගැනීමට 1 වූදිතට තිබූ බාධාව කුමක්ද?. තමන් විසින් ආයෝජනය කල මුදල සඳහා තහවුරු කිරීමක් ලෙස අවබෝධතා ගිවිසුමක් සකස් කල බව 1 වූදිතගේ ස්ථාවරයයි. මෙහිදී අවබෝධතා ගිවිසුම ලෙස 1 වූදිත අදහස් කර ඇත්තේ X 3 (අ) අවබෝධතා ගිවිසුම බවට සැකයක් නැත. කෙසේ නමුත් එකී අවබෝධතා ගිවිසුමේ එවන් ආයෝජනයක් පිලිබඳව කිසිවක් සඳහන් නොවේ. තවද තමන් ආයෝජනය කල මුදල සඳහා යම් තහවුරු කිරීමක් ලබා ගැනීමට විශේෂ උනන්දුවක් දැක්වූ 1 වූදිත ඒ සඳහා අවම වශයෙන් කුවිතාන්සියක් පවා ලබා නොගැනීම පුදුමසහගතය. ඉහත කරුණු සමස්තයක් ලෙස සැලකීමේදී පෙනී යන්නේ අදාල ඉඩම සඳහා රුපියල් මිලියන 5 ක් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් 1 වූදිත අසත්‍ය පැවසීමක් හෝ සත්‍ය කරුණු වසන් කිරීමක් සිදුකර ඇති බවයි.

පැමිණිලිකරු මුදල් ගෙවීම මග හරින බව යම් අවස්ථාවක තමාට වැටහුන බවත්, ඉන් පසුව පොරොන්දු නෝට්ටු අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස තමා ඔහුට දැන්වූ බවත්, ඔහු එය දින කිහිපයක්ම මගහරින ලද බවත්, එක් දිනක ඔහු තම නිවසට පැමිණ පොරොන්දු නෝට්ටුවලට අත්සන් කල බවත් 1 වුදිත ප්‍රකාශ කර ඇත. කෙසේ නමුත් 2015.05.29 දින 1 වූදිත විසින් පැමිණිලිකරුට තර්ජනාත්මක දුරකථන ඇමතුමක් දුන් බවට සහ එදිනම ඔහු පැමිණිලිකරුගේ කාර්යාලය අසලට

පැමිණ පැමිණිලිකරුට තර්ජනය කල බවට වූ පැමිණිල්ලේ පැහැදිලි ස්ථාවරය සම්බන්ධයෙන් 1 චූදිත සම්පූර්ණයෙන්ම නිහඬය. ඒ සම්බන්ධයෙන් හුදු ප්‍රතික්ෂේප කිරීමක් පවා කිරීමට 1 චූදිත අපොහොසත් වී ඇත. එම දුරකථන ඇමතුම පටිගත කරන ලද සංයුක්ත තැටිය සහ එහි අන්තර්ගතය ඇතුලත් මුද්‍රිත පිටපත පවා අධිකරණයට ඉදිරිපත් කර තිබියදී 1 චූදිත සිය විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ ඒ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම නිහඬව සිටීම පුදුමසහගත බව මාගේ අදහසයි. 1 චූදිත එවන් හුදු ප්‍රතික්ෂේප කිරීමක් පවා නොකලේ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිලිලේ සාක්ෂිවල කාවදින සුලු ස්වභාවය අනුව එය ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රායෝගික හැකියාවක් ඔහුට නොතිබූ නිසාද?. මෙවන් පසුබිමක් තුල තමා පැමිණිලිකරුට කිසිදු තර්ජනයක් නොකල බවට 1 චූදිත පොදුවේ කර ඇති ප්‍රකාශය කෙසේ හෝ චෝදනාවලින් ගැලවීම සඳහා කල හුදු ප්‍රකාශයක් පමණක් මිස සත්‍යයක් ලෙස මා හට පිලිගත නොහැක.

ඉහත විග්‍රහ කරන ලද කරුණු අනුව 1 චූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශය අසත්‍ය ලෙස සලකා ප්‍රතික්ෂේප කරමි.

මීලඟට 2 චූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශය සලකා බලමි. එහි හරය මා විසින් මීට පෙර සඳහන් කර ඇත. 3 චූදිතගේ ඉල්ලීම මත අදාල ඉඩම සඳහා රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බවත්, තම පවුලේ ව්‍යාපාරයක් වූ ඉන්ධන පිරවුම්හල් ව්‍යාපාරයට අදාල ගිණුමෙන්

රුපියල් මිලියන 10 ක් ලබාගෙන එම මුදලෙන් රුපියල් මිලියන 5 ක මුදලක් ඒ සඳහා ආයෝජනය කල බවත් 2 වූදිත පවසා ඇත. එහෙත් එම මුදල පැමිණිලිකරු වෙත ලබා දුන් බව ඇය කිසිදු අවස්ථාවක නිශ්චිතව ප්‍රකාශ කර නැත. එම මුදල ලබා දුන්නේ 3 වූදිතටද නැතහොත් පැමිණිලිකරුටද යන්න පවා පැහැදිලි නැත. එම මුදල ඇය විසින් පැමිණිලිකරු වෙත ලබා දුන් බවට පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී විත්තිය විසින් යෝජනාවක් කර තිබියදී පවා ඒ සම්බන්ධයෙන් ඇය නිහඬය. එම මුදල පැමිණිලිකරු වෙත ලබා දුන්නේ නම් ඒ බව නිශ්චිතව පැවසීමට 2 වූදිතට තිබූ අපහසුතාවය කුමක්ද?. ඒ අනුව පෙනී යන්නේ මෙම මුදල් අයෝජනය සම්බන්ධයෙන් 2 වූදිත සත්‍ය කරුණු වසන් කිරීමට උත්සාහ දරා ඇති බවයි.

2 වූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ සඳහන් කර ඇති අනෙකුත් කරුණු සියල්ලක්ම පාහේ පැමිණිල්ලේ නඩුවෙන් අනාවරණය වන කරුණු සමග බොහෝ සෙයින් සැසඳෙන බව පෙනේ.

ඉහත කරුණු අනුව 2 වූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශය මගින් පැමිණිල්ලේ නඩුව කෙරෙහි කිසිදු සාධාරණ සැකයක් ඇති නොවන බව තීරණය කරමි.

1, 2 වූදිතයන් වෙනුවෙන් කැඳවන ලද නුවන් රාජපක්ෂ නැමති සාක්ෂිකරුගේ සාක්ෂියෙන් අනාවරණය වන්නේ 1, 2 වූදිතයන් අධ්‍යක්ෂකවරුන් ලෙස ක්‍රියා කරන සමාගමක ගිණුමකින් 2014.01.13

දින චෙක්පතක් මගින් රුපියල් මිලියන 10 ක මුදලක් ආපසු ලබාගෙන ඇති බවයි. එමගින් විත්තිය මෙම අධිකරණයට ඒත්තු ගැන්වීමට උත්සාහ දරන ලද්දේ එසේ ආපසු ලබාගත් මුදලින් රුපියල් මිලියන 5 ක් අදාල ඉඩම සඳහා ආයෝජනය කල බවයි. එහෙත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඒ බව කිසිසේත්ම තහවුරු නොවේ. ආදල මුදල ආපසු ලබා ගත්තේ චූදිතයෙක් විසින්ද නැතහොත් වෙනත් තැනැත්තෙක් විසින්ද යන කරුණ පවා එම සාක්ෂියෙන් අනාවරණය නොවේ. අනෙක් අතට එම මුදල ඉඩම සඳහා ආයෝජනය කලේද නැතහොත් වෙනත් කටයුත්තක් සඳහා යෙදවූයේද යන කරුණද අනාවරණය නොවේ. ඒ අනුව මෙම සාක්ෂිකරු කැඳවීම මගින් විත්තියට කිසිදු වාසියක් අත්වී නොමැති අතර එම සාක්ෂියෙන් පැමිණිල්ලේ නඩුව කෙරෙහි කිසිදු සාධාරණ සැකයක් ඇති නොවේ.

ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැමිණිලිකරු සහ පැමිණිල්ලේ අනෙකුත් සාක්ෂිකරුවන් සත්‍ය ප්‍රකාශ කරන විශ්වසනීය සාක්ෂිකරුවන් බව තීරණය කරමි. 1 චූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශය අසත්‍ය ලෙස සලකා මේ වන විට මා විසින් ප්‍රතික්ෂේප කර ඇත. 2 චූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශය මගින් පැමිණිල්ලේ නඩුව කෙරෙහි කිසිදු සාධාරණ සැකයක් ඇති නොවන බවට මා නිගමනයකට එළඹ ඇත. විත්තිය වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකරුගේ සාක්ෂිය මගින්ද පැමිණිල්ලේ

නඩුව කෙරෙහි සාධාරණ සැකයක් ඇති නොවන බවට මා නිගමනයකට එලඹ ඇත.

**<u>බලෙන් ලබා ගැනීමේ චෝදනාවකදී පැමිණිල්ල විසින් ඔප්පු කල යුතු අංග</u>**

බලෙන් ලබා ගැනීමේ වරද දණ්ඩ නීති සංග්‍රහයේ 372 වගන්තියේ විස්තර කර ඇත. ඒ අනුව මෙම නඩුවේ සිද්ධිමය කරුණු අනුසාරයෙන් සැලකීමේදී පැමිණිල්ල විසින් ඔප්පු කල යුතු අංග පහත පරිදි දැක්විය හැක.

1. පැමිණිලිකරුට යම් පාඩු කිරීමේ බියක් ඕනෑකමින්ම ඇතිකර වීමෙන්
2. චෙක්පත් හෝ පොරොන්දු නෝට්ටු චූදිතයකුට දීම සඳහා
3. පැමිණිලිකරු වංක ලෙස පෙලඹවීම

මෙහි "පාඩු කිරීමේ " යන්නෙහි "පාඩුව "යනුවෙන් අදහස් කරන්නේ කායික වශයෙන්, මානසික වශයෙන්, කීර්තියට හෝ දේපලවලට නීති විරෝධීව සිදුකරනු ලබන යම් පීඩාවකි. මේ සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 43 වගන්තිය අදාල වේ.

"වංක ලෙස" යනුවෙන් අදහස් වන්නේ චූදිතයකුට අයුතු ලාභයක් හෝ පැමිණිලිකරුට අයුතු අලාභයක් කරවන අදහසින් චූදිතයෙක් යමක් කිරීමයි. මේ සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 22 වගන්තිය අදාල වේ.

"අයුතු ලාභය " යනුවෙන් අදහස් වන්නේ චූදිතයකුට නීත්‍යානුකූලව හිමි නැති දේපලක් නීති විරෝධී මාර්ග වලින් ලබා ගැනීමයි. චූදිතයෙක් යම් දේපලක් අයුතු ලෙස ළඟ තබා ගැනීමද ඔහු අයුතු ලාභයක් ලැබීමක්

ලෙස සලකනු ලැබේ. “අයුතු අලාභය” යනුවෙන් අදහස් වන්නේ පැමිණිලිකරුට නීත්‍යානුකූලව හිමි වූ දේපලක් නීති විරෝධී මාර්ග වලින් නැති වීමයි. මේ සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 21 වගන්තිය වැදගත් වේ.

## වැඩිදුරටත් සාක්ෂි විශ්ලේෂණය මගින් චෝදනා සම්බන්ධයෙන් නිගමනයන්ට එලඹීම

මූලික වශයෙන් ඉහත කී බලෙන් ලබා ගැනීමේ චෝදනාවේ අංග, කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවක ස්වභාවය සහ අනුබල දීමේ චෝදනාවක ස්වභාවය මනසේ රඳවාගෙන වැඩිදුරටත් සාක්ෂි විශ්ලේෂණය කරමින් චෝදනා සම්බන්ධයෙන් සුදුසු නිගමනයන්ට එලඹීමට බලාපොරොත්තු වෙමි. මෙහිදී ඉදිරිපත් වී ඇති සාක්ෂි සැලකිල්ලෙන් සහ සුපරික්ෂාකාරී ලෙස විශ්ලේෂණය කරමින් පැමිණිල්ල විසින් නිශ්චිතව ඔප්පු කර ඇති කරුණු පැහැදිලිව හඳුනාගත යුතුය. ඉන් අනතුරුව එලෙස ඔප්පු කර ඇති කරුණු පදනම් කර ගනිමින් සුදුසු අනුමිතියන්ට එලඹිය යුතුය.

චූදිතයන්ට එරෙහිව නගා ඇති චෝදනා සලකා බැලීමේදී පෙනී යන්නේ මෙම නඩුවේ සිද්ධි දාමය තුල ප්‍රධාන වශයෙන් අවස්ථා තුනක් හඳුනාගත හැකි බවයි. ඒවා පහත පරිදි වේ.

1. මෙහි මින් මතු "පලමු අවස්ථාව" ලෙස හඳුන්වනු ලබන 2015.04.10 දින හෝ ඊට ආසන්න දිනකදී චෙක්පත් 11 ක් ( X 6 සිට X 16 ) සම්බන්ධයෙන් වූ 1 සිට 7 දක්වා චෝදනා.

2. මෙහි මින් මතු "දෙවන අවස්ථාව " ලෙස හඳුන්වනු ලබන 2015.05.07 දින හෝ ඊට ආසන්න දිනකදී චෙක්පත් 8 ක් ( X 18 සිට X 25 ) සම්බන්ධයෙන් වූ 8 සිට 11 දක්වා චෝදනා.

3. මෙහි මින් මතු "තෙවන අවස්ථාව" ලෙස හඳුන්වනු ලබන 2015.06.02 දින හෝ ඊට ආසන්න දිනකදී පොරොන්දු නෝට්ටු 5 ක් ( X 26 සිට X 30 ) සම්බන්ධයෙන් වූ 12 සිට 15 දක්වා චෝදනා.

මම දැන් පලමු අවස්ථාවේ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් වූ චෝදනා පිලිබඳව වැඩිදුරටත් සලකා බලමි. පැමිණිලිකරු විසින් එම චෙක්පත් ලබා දී ඇත්තේ 2015.04.10 දිනය. ඒ 1 චූදිතගේ නිල නිවසේදීය. ඒ අවස්ථාවේ 1 චූදිත සුහදව කතා කල බව පැමිණිලිකරු පවසා ඇත. ඒ අවස්ථාවේදී හෝ ඊට පෙර පැමිණිලිකරුට කිසිදු චූදිතයකුගෙන් තර්ජනයක් හෝ බිය ගැන්වීමක් සිදුවූ බවක් සාක්ෂි වලින් අනාවරණය නොවේ. එසේනම් 1 සිට 7 දක්වා චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇත.

මීලඟට දෙවන අවස්ථාවේ චෙක්පත් 8 ක් සම්බන්ධයෙන් වූ චෝදනා පිලිබඳව වැඩිදුරටත් සලකා බලමි. පැමිණිලිකරු විසින් එම චෙක්පත් බිමල් ප්‍රනාන්දු මගින් 1 වූදිතගේ නිල නිවස වෙත යවා ඇත්තේ 2015.05.07 දිනය. ඒ පැමිණිලිකරු සහ 1 වූදිත අතර ඊට පෙර පැවති සාකච්ඡාවකදී ඇතිවූ එකඟත්වයක් මතය. ඉහත කී සාකච්ඡාවට පෙර පැමිණිලිකරු සහ 1 වූදිත අතර දුරකථන සංවාදයක්ද සිදුවී ඇති අතර එය සුහදශීලී ලෙස සිදුවූවකි. 2015.05.07 දින හෝ ඊට පෙරද පැමිණිලිකරුට කිසිදු වූදිතයකුගෙන් තර්ජනයක් හෝ බියගැන්වීමක් සිදුවූ බවක් සාක්ෂි වලින් අනාවරණය නොවේ. එසේනම් 8 සිට 11 දක්වා චෝදනාද සාධාරණ සැකයෙක් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇත.

මීලඟට තෙවන අවස්ථාව පිලිබඳව වැඩිදුරටත් සලකා බලමි. ඒ පොරොන්දු නෝට්ටු 5 ක් සම්බන්ධයෙන් වූ චෝදනාය. පැමිණිලිකරු විසින් පොරොන්දු නෝට්ටු අත්සන් කර ඇත්තේ 2015.06.02 දින 1 චූදිතගේ නිවසේදීය. එදින තම නිවසට පැමිණ තමා හමුවන ලෙස 1 චූදිත විසින් පැමිණිලිකරුට දුරකථනයෙන් දන්වා ඇත. පැමිණිලිකරු විසින් ඒ අවස්ථාවේ අත්සන් කර ඇත්තේ ඒ වන විට ලියා සකස් කර තිබූ පොරොන්දු නෝට්ටු පහකි.

ඉහත කී තෙවන අවස්ථාවට පෙර මෙම සමස්ත සිද්ධි දාමයේ උච්චතම අවස්ථාව ලෙස හඳුනාගත හැකි සිදුවීම සිදුවී ඇත. එනම් 2015.05.29 දින 1 චූදිත විසින් පැමිණිලිකරු වෙත දුන් තර්ජනාත්මක

දුරකථන ඇමතුම සහ එදිනම 1 චූදිත පිටකෝට්ටේ පිහිටි පැමිණිලිකරුගේ කාර්යාලය අසලට පැමිණ පැමිණිලිකරුට තර්ජනය කිරීමයි. 1 චූදිත එදින දුරකථනයෙන් පැමිණිලිකරුට තර්ජනය කර ඇත්තේ සවස 3.55 (පැය 15.55) ටය. ඒ 1 චූදිතගේ ජංගම දුරකථනයෙන් පැමිණිලිකරුගේ ජංගම දුරකථනය වෙත ඇමතුමක් ලබා ගැනීමෙනි. එහිදී 1 චූදිත පැමිණිලිකරුට තර්ජනාත්මකව පවසා ඇත්තේ පැමිණිලිකරුට පැමිණීමට නොහැකි වුවත් තමාගේ වැඩේ කර ගැනීම සඳහා තමා පැමිණිලිකරු හමුවීමට පැමිණෙන බවත්, තමා නරක මිනිහා කර නොගන්නා ලෙසත්, පලමුව තමාගේ ප්‍රශ්නය විසඳන ලෙසත්ය. මෙහිදී 1 චූදිත විසින් “අම්මට හුකෝගන්න” යන අසභ්‍ය වචන භාවිත කර ඇති අතර “තමුසෙ” යනුවෙන්ද පැමිණිලිකරු අමතා ඇත. මෙම දුරකථන ඇමතුමේදී සඳහන් කල ආකාරයට එදිනම 1 චූදිත පැමිණිලිකරු හමුවීම සඳහා ඔහුගේ කාර්යාලය අසලට ගොස් ඇත. ඒ සවස 5.00 ට 5.30 ට පමණය. ඒ අවස්ථාවේදීද 1 චූදිත ඔහුගේ වාහනය අසලට පැමිණිලිකරු කැඳවා නැවත පැමිණිලිකරුට තර්ජනය කර ඇත. ඒ “මාත් එක්ක දඟලන්න එන්න එපා. මගේ හැටි තමුසෙ දන්නවනේ. (අසභ්‍ය වචන කිහිපයක්). අද දවස ඇතුලත මගේ ප්‍රශ්නේ විසඳනවා. නැත්නම් තමුසෙ මම වැරදි මිනිහා කියන්න එපා” යනුවෙනි. ඉහත සඳහන් කල තර්ජනාත්මක ප්‍රකාශයන් තමාට ශාරීරික හෝ මානසික හානියක් සිදුවිය හැකි බවට ඕනෑම සාධාරණ පුද්ගලයෙක් නිතැනිත්ම බියට පත්වන ආකාරයේ ප්‍රකාශයන් බව

අමුතුවෙන් කිව යුතු නැත. මෙවන් තර්ජනාත්මක ප්‍රකාශයන්හි අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ සමාජයේ ජීවත්වන ඕනෑම සාමාන්‍ය සාධාරණ පුරවැසියකුගේ මනස තුල බියක් ඇති වීමයි. පැමිණිලිකරුට පාඩු කිරීමේ බියක් ඇතිවන ආකාරයෙන් 1 වූදිත විසින් ඔහුට තර්ජනය කර ඇති බව ඉහත කරුණු අනුව පැහැදිලිය.

ඉහත කී දුරකථන ඇමතුම සහ 1 වූදිත පැමිණිලිකරුගේ කාර්යාලය අසලට යාම පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී විත්තිය විසින් නිශ්චිතව අභියෝගයට ලක් කිරීමක් පවා සිදු කර නැත. අනෙක් අතට 1 වූදිත විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේද ඔහු ඒ සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ කර නැත. ඇත්තෙන්ම ඔහු ඒ සම්බන්ධයෙන් හුදු ප්‍රතික්ෂේප කිරීමක් පවා කිරීමට අපොහොසත් වී ඇති අතර ඒ සම්බන්ධයෙන් ඔහු සම්පූර්ණයෙන්ම නිහඬය.

නඩුවේ කරුණු සමස්තයක් ලෙස සැලකීමේදී පැහැදිලිව පෙනී යන්නේ පැමිණිලිකරු විසින් 2015.06.02 දින 1 වූදිතගේ නිවසේදී පොරොන්දු නෝට්ටු අත්සන් කර ඇත්තේ ඔහුට 2015.05.29 දින එල්ල වූ ඉහත කී තර්ජනයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස බවයි. ඒ අවස්ථාවේ පොරොන්දු නෝට්ටු අත්සන් කරන ලෙස පැමිණිලිකරුට දන්වා ඇත්තේ 1 වූදිත විසිනි. පැමිණිලිකරු ඊට අවනත වෙමින් පොරොන්දු නෝට්ටු අත්සන් කර ඇත. ඉහත කී තර්ජනය හේතුකොට ගෙන ඒ වන විට පැමිණිලිකරු බියට පත්ව සිටි බවට කිසිදු සැකයක්

නොමැති බව සිද්ධි දාමය සැලකිල්ලෙන් විශ්ලේෂණය කිරීමේදී මනාව පෙනේ. තවද ඒ අවස්ථාවේ 1 චූදිතගේ නියමය අනුව පොරොන්දු නෝට්ටු අත්සන් කිරීම හැර වෙනත් කිසිදු විකල්පයක් නොමැති තත්වයට පැමිණිලිකරු පත්ව සිටි බවද පැහැදිලිව පෙනේ. මෙම තර්ජනය පැමිණිලිකරු වෙත එල්ල වූයේ එවකට බස්නාහිර පලාතේ ප්‍රධාන අමාත්‍යවරයාගෙනි. තවද මෙම තර්ජනය ප්‍රධාන අමාත්‍ය ධූරය වැනි සැලකිය යුතු රාජ්‍ය සහ දේශපාලන බලයක් සහිත නිලයක් දරණ තැනැත්තකුගෙන් අසභ්‍ය වචනද සමග තර්ජනාත්මක ස්වරයකින් එල්ල වූවක් බව කිසිසේත්ම අමතක කල නොහැක. ඇත්තෙන්ම 1 චූදිත තමා දැරූ නිලය තුල ගැබ්ව තිබූ බලය තර්ජනාත්මක ලෙස පැමිණිලිකරු වෙත මුදාහරිමින් ඔහු බියට පත්කර ඇති බව පැහැදිලිය. තර්ජනාත්මක දුරකථන ඇමතුමෙන් පසුව 1 චූදිත පැමිණිලිකරුගේ කාර්යාලය අසලට පුද්ගලිකවම පැමිණ නැවත ඔහුට තර්ජනය කිරීම මගින් තර්ජනයේ ප්‍රබලත්වය වඩාත් තීව්‍ර වී ඇති බව මට පෙනේ.

මෙහිදී සලකා බැලිය යුතු තවත් කරුණක් ඇත. එනම් අදාල අවස්ථාවේ 1 චූදිත වංක ලෙස ක්‍රියා කර තිබේද යන්නයි. එය බලෙන් ලබා ගැනීමේ වරදේ අනිවාර්ය අංගයකි.

මේ සම්බන්ධයෙන් නිගමනයකට එලඹීමේදී මෙම නඩුවේ චෝදනාවලට පසුබිම සැකසූ ගනුදෙනුවේ ස්වභාවය කෙරෙහි අවධානය යොමු කල යුතුය. මෙම තීන්දුවේ මීට පෙර සඳහන් කර ඇති

ආකාරයට 2015.04.07 දින පැමිණිලිකරු විසින් අදාල ඉඩම රුපියල් මිලියන 204.8 ක පමණ මුදලකට විකුණන ලදී. ඒ චූදිතයන්ගේද එකඟත්වය ඇතිවය. 2014.01.17 දිනැති අවබෝධතා ගිවිසුමේ එකඟත්වයන් අනුව ඉඩමෙන් ලැබෙන ලාභයෙන් 14 %ක් 2 චූදිතට හිමිවන අතර 17% ක් 3 චූදිතගේ බිරිඳට හිමිවේ. අවබෝධතා ගිවිසුමේ මේ අයුරින් සඳහන් වුවද මෙම සිද්ධි මාලාවේ මුල් කාලය තුල බොහෝ අවස්ථාවන්හිදී 1, 2, 3 චූදිතයන් එක් ඒකකයක් ලෙස ක්‍රියා කර ඇති බව පෙනේ.

ඉහත කී 14% ක් වූ ප්‍රතිශතය අනුව 2 චූදිතට හිමිවිය යුතු මුදල දල වශයෙන් රුපියල් මිලියන 28.7 ක් පමණ වේ. 3 චූදිතට (ඔහුගේ බිරිඳට) හිමිවිය යුතු මුදල දල වශයෙන් රුපියල් මිලියන 34.8 ක් පමණ වේ. ඒ අනුව 2, 3 චූදිතයන්ට හිමිවිය යුතු සම්පූර්ණ මුදල දල වශයෙන් රුපියල් මිලියන 64 ක් පමණ වේ. පලමු අවස්ථාවේ 2, 3 චූදිතයන්ගේ නම් වලට ලියන ලද චෙක්පත් 11 හි සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 64 ක් වූයේ එම පදනම මත බව පැහැදිලිය.

ඉන් අනතුරුව පැමිණිලිකරු සහ 1 චූදිත අතර පැවති සාකච්ඡාවකදී ඔවුන් අතර වෙනත් එකඟත්වයක් ඇතිවී ඇත. එනම් මුලින් ලබා දුන් චෙක්පත් අතුරින් චූදිතයන් ඒ වන විට මුදල් කරගෙන තිබූ රුපියල් මිලියන 8 ක මුදල සහ ඉඩම සංවර්ධනය කිරීම සඳහා පැමිණිලිකරු විසින් වියදම් කරන ලද මුදල අඩුකර රුපියල් මිලියන

34 ක පමණ මුදලක් චූදිතයන් වෙත ගෙවීමටයි. ලාභය ගණනය කල යුත්තේ වියදම් අඩු කිරීමෙන් පසුව බව ඉහත කී අවබෝධතා ගිවිසුමේද සඳහන් වේ. දෙවන අවස්ථාවේ 2, 3 චූදිතයන්ගේ නම් වලට ලියන ලද චෙක්පත් 8 හි සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 34 ක් පමණ වූයේ එම පදනම මතය.

දෙවන අවස්ථාවේ චෙක්පත් ලබා දීමේදී පැමිණිලිකරු සහ 1 චූදිත අතර චෙක්පත් සම්බන්ධයෙන් යම් එකඟත්වයක් ඇතිවී තිබිණ. එම එකඟත්වය වූයේ ඒ වන විට බැංකුගත නොකර ඉතිරිව තිබූ චෙක්පත් පැමිණිලිකරු වෙත ආපසු ලබා දීමටයි. එහෙත් 1 චූදිත විසින් පැමිණිලිකරුට කිසිදු චෙක්පතක් කිසිදු අවස්ථාවක ආපසු ලබා දී නැත. ඒ අනුව පොරොන්දු නෝට්ටු අත්සන් කල 2015.06.02 දින වන විට 2 චූදිතගේ නමට ලියන ලද රුපියල් මිලියන 40.5 ක වටිනාකමින් යුත් චෙක්පත් 6 ක් ( X 6, X 7, X 8, X 18, X 19 සහ X 20 ) 1 චූදිත සතුව තිබිණ. එම චෙක්පත් අතුරින් චෙක්පත් තුනක් දින රහිත ඒවා වූ අතර අනෙක් චෙක්පත් තුන ඉදිරි දින ( 2015.06.02 දිනට පසු දිනයන් ) යොදා තිබූ චෙක්පත් විය. ඒ අනුව තමා වෙත උපරිම වශයෙන් රුපියල් මිලියන 34 ක් පමණක් ලැබීමට තිබියදී රුපියල් මිලියන 40.5 ක වටිනාකමකින් යුත් චෙක්පත් කිහිපයක් තවදුරටත් රඳවා ගනිමින් රුපියල් මිලියන 25 ක වටිනාකමකින් යුත් පොරොන්දු නෝට්ටු කිහිපයකට අත්සන් කිරීමට 1 චූදිත විසින් පැමිණිලිකරු පොලඹවා ඇත. මෙහිදී තමාට ලැබීමට නියමිත මුදලට

වඩා වැඩි වටිනාකමක් සහිත චෙක්පත් තවදුරටත් අයුතු ලෙස රඳවා ගැනීමෙන් සහ එලෙස රඳවා ගැනීම හේතුකොටගෙන තමාට ලබා ගැනීමට හිමිකමක් නොමැති පොරොන්දු නෝට්ටු කිහිපයක් ලබා ගැනීමෙන් 1 චූදිත අයුතු ලාභයක් ලබා ඇත.

අනෙක් අතට යම් ගැටළුසහගත තත්වයක් උද්ගත වුවහොත් එය සාකච්ඡා මාර්ගයෙන් සුහදශීලී ලෙස විසඳා ගත යුතු බවට ඉහත කී අවබෝධතා ගිවිසුමේ කොන්දේසියක් මගින් සියළු පාර්ශවකරුවන් එකඟ වී ඇත. එසේනම් මෙවන් ගැටළුවක් විසඳාගත යුතුව තිබුණේ සාකච්ඡා මාර්ගයෙන් සුහදශීලී ලෙස මිස තර්ජනාත්මකව බියක් ඇතිකරවීමෙන් නොවේ. මෙම ගැටළුව සුහදශීලී ලෙස විසඳා ගැනීමට නොහැකි වූයේ නම් 1 චූදිත විසින් කල යුතුව තිබුණේ පැමිණලිකරුට එරෙහිව නීතිමය පියවර ගැනීමයි. එහෙත් ඔහු ඒ අයුරින් ක්‍රියාකර නැත. ඒ අනුව ඔහු ක්‍රියාකර ඇත්තේ අදාල මුදල නීති විරෝධී මාර්ගයකින් ලබා ගැනීමටයි. එයද අයුතු ලාභයකි.

නඩුවේ කරුණු වැඩිදුරටත් විශ්ලේෂණය කිරීමේදී මෙම සිද්ධියේ වැදගත් පැතිකඩක් නිරීක්ෂණය වේ. ඒ පිලිබඳව අවධානය යොමු කිරීම සුදුසු බව මට පෙනේ. අදාල ඉඩම පැමිණිලිකරු විසින් මිලට ගත් ඉඩමක් වූ අතර එහි එකම අයිතිකරු වූයේ පැමිණිලිකරුය. එම ඉඩමේ කිසිදු නීත්‍යානුකූල අයිතියක් කිසිදු අවස්ථාවක චූදිතයන්ට තිබී නැත. ඒ අනුව 1 චූදිත ක්‍රියාකර ඇත්තේ පැමිණිලිකරු ඔහු සතු ඉඩම විකිණීමෙන් ලද මුදලෙන් කොටසක් කෙසේ හෝ ලබා

ගැනීමටයි. ඉහත කී අවබෝධතා ගිවිසුමේ කුමක් සඳහන් වුවද සත්‍ය වශයෙන් සිදුවී ඇත්තේ එය බව ප්‍රායෝගික බුද්ධිය මෙහෙයවමින් සිදුවීම් මාලාව දෙස බැලීමේදී පැහැදිලිව පෙනේ. තවද මෙම අවබෝධතා ගිවිසුම චූදිතයන්ගේ අවශ්‍යතාවය මත සකස් කල ලේඛනයක් බව පැමිණිලිකරුගේ සාක්ෂියෙන් අනාවරණය වේ. අවබෝධතා ගිවිසුම සකස් කලේ තමා විසින් 3 චූදිත මගින් කල දැන්වීම අනුව බව 1 චූදිත සිය විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශයේ පවා සඳහන් කර ඇත. ඒ අනුව ඉඩමේ භූමි ප්‍රමාණය පාර්ශවකරුවන් අතර බෙදී යන ආකාරය සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමේ සඳහන් කර ඇති ප්‍රතිශතයන් නීත්‍යානුකූල පදනමක් මත යොදන ලද අගයන් ලෙස සැලකීම අසීරුය. මා ඉහත සඳහන් කල ආකාරයට ඉඩමේ එකම නීත්‍යානුකූල අයිතිකරු වූයේ පැමිණිලිකරු බව කිසිවිටෙකත් අමතක නොකල යුතුය. ඇත්තෙන්ම මෙහිදී 1 චූදිත සිදුකර ඇත්තේ තමාට නීත්‍යානුකූලව හිමි නැති දෙයක් නීති විරෝධී ලෙස ලබා ගැනීමයි.

අනෙක් අතට මෙම ඉඩම සංවර්ධනය කිරීමෙන් කිසිදු ලාභයක් ඉපයීමට නොහැකි වූ අතර පැමිණිලිකරු මුහුණ දී සිටි මූල්‍යමය දුෂ්කරතා හේතුකොටගෙන පලාත් සභාව සඳහා යෝජිතව තිබූ ගබඩා සංකීර්ණය ඉදිකිරීමටද ඔහු අපොහොසත් විය. ඉඩම සංවර්ධනය කිරීම සඳහා තම බිරිඳ විසින් රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කල බව සත්‍යයක් ලෙස පිලිගත්තද 1 චූදිත ක්‍රියාකර

ඇත්තේ පැමිණිලිකරුගෙන් ඊට වඩා බෙහෙවින් වැඩි මුදලක් ලබා ගැනීමටයි. අනෙක් අතට ඒ වන විට ඔහු පැමිණිලිකරු විසින් ලබා දුන් රුපියල් මිලියන 5 ක චෙක්පතක් මුදල් කරගෙනද අවසන්ය. ඒ පැමිණිලිකරු විසින් 2015.04.10 දින ලබා දුන් එදිනම මුදල් කරගත් X 10 මුදල් චෙක්පතයි. මෙම කෝණයෙන් සිද්ධිය දෙස බලන විටද පෙනී යන්නේ 1 වූදිත සිදුකර ඇත්තේ තමාට නීත්‍යානුකූලව හිමි නැති දෙයක් නීති විරෝධී ලෙස ලබා ගැනීම බවයි.

ඉහත කරුණු අනුව තමා වෙත පොරොන්දු නෝට්ටු භාරදීමට 1 වූදිත විසින් පැමිණිලිකරු වංක ලෙස පොලඹවා ඇති බව තීරණය කරමි.

1 වූදිතගේ නිවසේදී පැමිණිලිකරු විසින් පොරොන්දු නෝට්ටු අත්සන් කල අවස්ථාවේ 2 වූදිත නිවසේ නොසිටි අතර ඇය නිවසට පැමිණ ඇත්තේ පැමිණිලිකරු නිවසින් පිටව යන අවස්ථාවේදීය. 3 වූදිත ඒ වන විට විදේශගතව සිටි බව අනාවරණය වේ.

පොරොන්දු නෝට්ටු සම්බන්ධයෙන් වූ බලෙන් ලබාගැනීමේ වරදට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව පිලිබඳව සලකා බැලීමේදී පෙනී යන්නේ ඒ සඳහා වූදිතයන් එකඟ වූ බවට නැතහොත් ඔවුන් අතර ඒ සඳහා එකඟත්වයක් තිබූ බවට නිශ්චිත සාක්ෂි ඉදිරිපත් වී නොමැති බවයි. එසේනම් 12 චෝදනාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇත.

පොරොන්දු නෝට්ටු සම්බන්ධයෙන් 2, 3 චූදිතයන්ට එරෙහිව නගා ඇති අනුබල දීමේ චෝදනා සම්බන්ධයෙන් සලකා බැලීමේදී පෙනී යන්නේ ඒ සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව නිශ්චිත සාක්ෂි ඉදිරිපත් වී නොමැති බවයි. එසේනම් 14, 15 චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇත.

**<u>අවසන් නිගමනය</u>**

ඉහත හේතු අනුව 1 චූදිතට එරෙහිව නගා ඇති 13 චෝදනාව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බව තීරණය කරමි. 1 චූදිතට එරෙහිව නගා ඇති අනෙක් චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බව තීරණය කරමි.

2, 3 චූදිතයන්ට එරෙහිව නගා ඇති කිසිදු චෝදනාවක් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බව තීරණය කරමි.

ඒ අනුව 1 චූදිත 1, 2, 5, 8, 9, 12 චෝදනාවලින් නිදොස් කරමි. 1 චූදිත 13 චෝදනාවට වරදකරු කරමි.

2 චූදිත 1, 3, 6, 8, 10, 12, 14 චෝදනාවලින් නිදොස් කරමි.

3 චූදිත 1, 4, 7, 8, 11, 12, 15 චෝදනාවලින් නිදොස් කරමි.

(මංජුල තිලකරත්න)

මහාධිකරණ විනිසුරු - කොළඹ

2022.06.06